# කාර්යසාධන වාර්තාව

# 2021



මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග,
සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන,
මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික,
හා වතු යටිතල පහසුකම් කටයුතු අමාත්‍යාංශය.

# කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර, හින්දු සංස්කෘතික හා වතු යටිතල පහසුකම් කටයුතු අමාත්‍යාංශය

## මධ්‍යම පළාත

**අංක 1060,ගැටඹේ**

**පේරාදෙණිය**

## දැක්ම

තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය තුළින් ශක්තිමත් ආර්ථිකයක් සහිත නිරෝගිමත් ජනතාවක් වෙසෙන සෞභාග්‍යමත් මැදරටක්

## මෙහෙවර

මනා සම්පත් කළමනාකරණයක් තුළින් මධ්‍යම පළාත තුළ කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික කටයුතු හා වතු යටිතල පහසුකම් සංවර්ධන යන ක්ෂේත්‍රවල තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා මෙහෙයවීම තුළින් කෘෂිකර්ම නිෂ්පාදනවල අගය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය කිරීමෙන් ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සකස් කිරීම, පෝෂණ ඌණතා තුරන් කිරීම, වතු හා ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම, හින්දු ජනතාවගේ සංස්කෘතිමය අභිවෘද්ධිය සැලසීම, නව්‍ය හා වාණිජමය නැඹුරුතාවයකින් යුතු තාක්ෂණික දැනුම හා ශිල්ප ක්‍රම උපයෝගි කර ගනිමින් ප්‍රශස්තව සම්පත් උපයෝජනය තුළින් විෂයානුබද්ධ ක්ෂේත්‍රයන්හි ඵලදායිතාවය නංවාලීම

1.1 අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන් :-

1. ආහාර බෝග නිෂ්පාදනය වැඩි කිරීම, ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.

2. වස විසෙන් තොර දේශීය ආහාර නිෂ්පාදනය හා පරිභෝජනය ප්‍රචලිත කිරීම සහ ගෙවතු වගාව ප්‍රවර්ධනය.

3. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම.

4. ලොකු ළූණු බීජ, බීජ අර්තාපල් හා බීජ බෝංචි ඇතුළු දේශීය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම.

5. කෘෂි මාර්ග සංවර්ධනය

6. කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වාරි පහසුකම් වැඩි දියුණු කිරීම.

7. පළාතේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ජාතික කිරි නිෂ්පාදනයට ලබාදෙන දායකත්වය වැඩි කිරීම

8. පළාතට අවශ්‍ය ගුණාත්මක තත්වයේ සතුන් බිහි කර ගැනීම හා ඔවුන්ගේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය වර්ධනය කරමින් පශු සම්පත් ක්ෂේත්‍රය බල ගැන්වීම

9. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම හා පරිභෝජනය ජනප්‍රිය කිරීම තුළින් පළාතේ ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීමට දායක වීම.

10. විසිතුරු මත්ස්‍ය වගා ක්ෂේත්‍රය තුළින් ස්වයං රැකියා අවස්ථා බිහි කිරීම.

11. පළාතේ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම

12. පළාතේ වන ගහනය ආරක්ෂා කිරීම, වැඩි කිරීම, ඒ තුළින් ජල පෝෂක ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම

13. පළාතේ කසළ කළමනාකරණය සඳහා දායකත්වය ලබා දීම

14. වතු යටිතල පහසුකම් සංවර්ධනය තුළින් වතු ප්‍රජාවගේ ජීවන මට්ටම වර්ධනය කිරීම

15. මධ්‍යම පළාතේ හින්දු ආගමික ජනතාවගේ සාහිත්‍ය, කලා, ආගමික සහ සමාජ සුභසාධන අංශයන්හි ප්‍රබෝධයක් ඇති කිරීම තුළින් හින්දු සංස්කෘතික කටයුතු වල අභිවෘද්ධියක් ඇති කිරීම.

.

## 1.2 . හැඳින්වීම

මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම,වාරිමාර්ග,සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන මිරිදිය ධීවර, පරිසර, හින්දු සංස්කෘතික හා වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා 2021 වර්ෂයේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහිදී සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය සහ මධ්‍යම පළාත් සභා පස් අවුරුදු සැළැස්ම (2019 - 2023) අනුව මෙම අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සංවර්ධන හා සුළු වාරිමාර්ග යන පළාත් දෙපාර්තමේන්තු තුන හා මිරිදිය ධීවර, පරිසර, වතු යටිතල පහසුකම් සංවර්ධන හින්දු සංස්කෘතික හා කෘෂි මාර්ග සංවර්ධන යන අංශ මගින් මෙම වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කරනු ලැබීය.

2021 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර සාර්ථකව නිම කරන ලද්දේ පැවති COVID 19 වසංගත තත්වය හමුවේය. කෙසේ වෙතත් 2021 වර්ෂය තුළ පැවති COVID 19 වසංගත තත්වය මෙන්ම ජාතික ආර්ථික පද්ධතිය තුළ සිදු වූ විවිධ අර්බුධකාරී තත්වය හමුවේ මෙම අමාත්‍යාංශයට අයත් සියලුම දෙපාර්තමේන්තු හා අංශවලට වෙන් වූ ප්‍රතිපාදන යොදවා සැලසුම් කල සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණි.

2021 වර්ෂය සඳහා වෙන් වූ මුළු ප්‍රතිපාදන රු.මි 370 ක් යොදවා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා අංශ මගින් අනුමත නව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

ඒ යටතේ ආහාර සුරක්ෂිතතාවයෙන් යුත් සෞභාග්‍යමත් මැදරටක් බිහි කිරීමේ අභිලාෂයෙන් තිරසාර කෘෂිකාර්මික ක්‍රම මගින් පළාතේ ආහාර නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩිකිරීමත් ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා සහ ජාතික ආර්ථිකයට මධ්‍යම පළාතෙන් ලබා දිය හැකි දායකත්වය ඉහළ නැංවීම උදෙසාත් පහත දැක්වෙන පරිදි පළාත් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලැබීය.

- පළාතට පැවරි තිබෙන බීජ නිෂ්පාදන වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම.
- කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
- වගා කටයුතු දිරිමත් කිරීම සඳහා 50% පදනම යටතේ ප්‍රදානයන් ලබා දීම.
- වගා නොකල ඉඩම් යලි වගා කිරීම සහ අතිරේක බෝග වගාවට ප්‍රමුඛත්වයක් ලබා දීම.
- ගොවි ප්‍රජාවගේ හා වතු ප්‍රජාවගේ කෘෂි දැනුම වැඩි කිරීම,
- කෘෂි පාදක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- නිලධාරීන් අවශ්‍ය නව දැනුම හා පුහුණුව ලබා දීම.
- පළාතේ කෘෂිකර්ම කාර්යාලවල පහසුකම් සංවර්ධනය කිරීම

මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කිරි,මස්,බිත්තර හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වලින් ස්වයංපෝෂිත කිරීමත් ජනතාවගේ පෝෂණ තත්වය වැඩි දියුණු කිරීමත් එම ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය වැඩි කිරීමත් අරමුණු කර ගනිමින් මැදරට පශු නවෝදය තුළින් සුවිශේෂි මෙහෙවරක් සිදුකරනු ලබයි.

කිරි, බිත්තර හා මස් යන ආහාර වර්ග තුනෙහි නිෂ්පාදනය සැලකිමේදි විශේෂයෙන් කිරි නිෂ්පාදනය සැලකිමේදි සෑම වර්ෂයකදීම ජාතික නිෂ්පාදනයෙන් 30% ට වැඩි ප්‍රමාණයකට දායකත්වය ලබා දෙන්නේ දේශයේ කිරි උල්පත ලෙස හඳුන්වන මධ්‍යම පළාතයි. ඒ සඳහා මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

- පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදනය සහ නිෂ්පාදන ඵලදායිතාව වර්ධනය කිරීම
- වෙළඳපල, අගය එකතු කල හා පශු සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිත ආදායම් උත්පාදන කටයුතු
- මානව සම්පත් සංවර්ධනය
- පුහුණු හා තොරතුරු තාක්ෂණ පහසුකම් සංවර්ධනය

මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ

- වාරිමාර්ග පද්ධති නඩත්තු කිරීම
- වැඩි ගොවිබිම් ප්‍රමාණයක් වගා කිරීම සඳහා වගාබිම් වෙත නිකුත් කරනු ලබන වාරි ජලය මනාව කළමනාකරණය කිරීම
- නව වාරි තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම

තුළින් තිරසාර වාරි ජල සැපයුමක් ලබා දීමේ අපේක්ෂාවෙන් පළාත් සුළු වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම අමාත්‍යාංශය යටතේ පවතින මිරිදිය ධීවර අංශය මගින් පළාතේ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා මධ්‍යම පළාතේ මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ලබාදෙන දායකත්වය වැඩිකිරීම සඳහා මධ්‍යම පළාතේ කුඩා ,මධ්‍ය හා විශාල පරිමාණ ජලාශ ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය හා මිරිදිය ඉස්සන් ගහණය වර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

මෙම අංශය මගින් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති මගින් පහත සඳහන් නිමවුම් ළගා කර ගත හැකිවිය.

- සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් නිෂ්පාදනය ඉහළ නැංවීම
- පළාත තුළ සත්ව ප්‍රෝටීන බහුල කිරීම තුළින් ජනතාවගේ ප්‍රෝටීන ඌනතාවය අවම කිරීම.
- පළාතේ ගොවි ජනතාවට අමතර ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීම.
- ධීවර ප්‍රජාවගේ සමාජීය හා ආර්ථික සංවර්ධනය ඇති කිරීම

මව්බිමේ සුවිශේෂී පාරිසරික කලාපයක් වන මධ්‍යම පළාත් පරිසරය ජෛව විවිධත්වයෙන් යුත් පාරිසරික සංවේදී කලාපයකි. මෙහි පරිසරයට සිදු වන බලපෑම්වලින් පීඩාවට පත් වන්නේ සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවමයි. මේනිසා මධ්‍යම පළාතේ පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම තුළින් ,සමස්ත පරිසර පද්ධතියේම සමතුලිත බව හා පාරිසරික තිරසාරත්වය ආරක්ෂා කිරීමට හැකියාව ලැබෙයි. ඒ සඳහා පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් යටතේ වාර්ෂිකව ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.

- ලෝක පරිසර දින වැඩසටහන
- මධ්‍යම පළාතේ වන ගහණය වැඩි කිරීමේ වැඩසටහන
- කසළ කළමනාකරණ වැඩසටහන

මධ්‍යම පළාත් වතු යටිතල පහසුකම් අංශය මගින්,

- මධ්‍යම පළාතේ වතු ප්‍රජාව සඳහා යටිතල පහසුකම් සපුරාලීම
- ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීම.
- දෛනික කටයුතු පහසු කිරීම හා ග්‍රාමීය ප්‍රජාව අතර සමාජ සබඳතා වැඩිදියුණු කිරීම ද

කෘෂි මාර්ග සංවර්ධන මගින්

- කෘෂි ප්‍රජාව සඳහා සුදුසු කෘෂි මාර්ග පද්ධතියක් සකස් කරලීම තුළින් ගොවි ජනතාවගේ නිෂ්පාදන පිරිවැය අවම කිරීමට දායක වීම
- පාරිභෝගිකයින්ට ඉතා හොඳ කෘෂි නිෂ්පාදන අවම මිලකට ලබා ගැනීමට හැකි වටපිටාවක් ඇති කිරීම ද සිදු කරනු ලැබේ

මධ්‍යම පළාත තුළ වෙසෙන හින්දු භක්තිකයින්ගේ සංස්කෘතික, සමාජීය හා ආගමික ප්‍රවර්ධනය වෙනුවෙන් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන්නේ හින්දු සංස්කෘතික අංශය මගිනි. විශේෂයෙන්ම හින්දු බැතිමතුන් බහුලව ජීවත්වන මධ්‍යම පළාත තුළ ඔවුන් හට වන්දනා කිරීම, ඔවුන්ගේ ඇදහිම් හා සාම්ප්‍රදායික පුද පූජා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලසීම කරනු ලැබේ. ඒ අනුව පහත සඳහන් ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩසටහන් දියත් කරනු ලැබේ.

- හින්දු කෝවිල් ආකර්ශනීය ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පරිදි කෝවිල ප්‍රතිසංස්කරණය
- හින්දු කෝවිල් සඳහා භෞතික පහසුකම් සැපයීම සිදුකරන ලදි.

**1.3 සංවිධාන සටහන**



ලේකම්
ආයතන අංශය
සැලසුම් හා සංවර්ධන අංශය
ගිණුම් අංශය
විගණන අංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) සැලසුම් හා ප්‍රගති පාලන
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) වතු යටිතල හා මිරිදිය ධීවර
ගණකාධිකාරී
සහකාර ලේකම් (පාලන)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) හින්දු සංස්කෘතික
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) පරිසර හා කෘෂි මාර්ග
සහකාර ලේකම් (සංවර්ධන)
පරිපාලන නිලධාරි
ප්‍රධාන කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
මූල්‍ය සහකාර
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කාර්යාල කාර්ය සහයක
රියදුරු
කාර්යාල කාර්ය සහයක
කාර්යාල කාර්ය සහයක

1.4. 2021 වර්ෂයේ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - ප්‍රතිපාදන වෙන්වීම් (රු.මි)




1.4.1 මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් සියලුම විෂයන් යටතේ 2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්වීම්

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රතිපාදන වෙන්වීම (රු.මි 331.56)




උපමාන පාදක ප්‍රතිපාදන ප්‍රදාන වෙන්වීම (රු.මි 39)
5.00
5.00
10.00
14.00
1.00
1.94
2.06
පරිසර අංශය
හින්දු සංස්කෘතික අංශය
කෘෂි මාර්ග අංශය
වතු යටිතල අංශය
හදිසි සංවර්ධන
මූලධන වත්කම් පුනරුත්තාපනය හා ...
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම


මධ්‍යම රජයේ ප්‍රතිපාදන (රු.මි)
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
43.95
70.00
394.17

1.5 2021 ව වර්ෂයට වෙන් වූ ප්‍රතිපාදන අනුව සමස්ත ප්‍රගති සාරාංශය

| අනු අංකය | දෙපාර්තමේන්තු/අංශ | වෙන්කළ ප්‍රතිපාදන (රු. මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැඩ නිමකළ ව්‍යාපෘති | සමස්ත භෞතික ප්‍රගතිය % | වියදම (රු. මි) | අතැති බිල්පත් (රු. මි) | වියදම (රු. මි) | % |
| *පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන* | | | | | | | | | |
| 1 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 100.56 | 29 | 27 | 97% | 59.44 | 26.80 | 86.23 | 86 % |
| 2 | සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | 70.00 | 19 | 18 | 96% | 38.32 | 15.57 | 53.89 | 77 % |
| 3 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 125.00 | 67 | 67 | 100% | 110.23 | 14.29 | 124.52 | 100 % |
| 4 | මිරිදිය ධීවර අංශය | 10.00 | 6 | 6 | 100% | 10.00 | - | 10.00 | 100 % |
| 5 | වතු යටිතල පහසුකම් අංශය | 26.00 | 16 | 16 | 100% | 23.62 | 2.34 | 25.96 | 100 % |
| එකතුව | | **331.56** | **137** | **134** | **99%** | **241.60** | **59.00** | **300.60** | **91 %** |
| *උපමාන පාදක ප්‍රදාන* | | | | | | | | | |
| 1 | පරිසර අංශය | 5.00 | 7 | 7 | **100%** | 5.00 | - | 5.00 | 100% |
| 2 | හින්දු සංස්කෘතික අංශය | 5.00 | 2 | 2 | **100%** | 5.00 | - | 5.00 | 100% |
| 3 | කෘෂි මාර්ග සංවර්ධන අංශය | 10.00 | 9 | 9 | **100%** | 9.84 | - | 9.84 | 98% |
| 4 | වතු යටිතල පහසුකම් අංශය | 14.00 | 10 | 10 | **100%** | 13.98 | - | 13.98 | 100% |
| 5 | හදිසි සංවර්ධන | 1.00 | 2 | 2 | **100%** | 1.00 | - | 1.00 | 100% |
| 6 | මූලධන වත්කම් පුනරුත්ථාපනය | 1.94 | 3 | 3 | **100%** | 1.94 | - | 1.94 | 100% |
| 7 | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 2.06 | 1 | 1 | **100%** | 2.06 | - | 2.06 | 100% |
| එකතුව | | **39.00** | **34** | **34** | **100%** | **38.81** | **0.00** | **38.81** | **100%** |

| අනු අංකය | දෙපාර්තමේන්තු/අංශ | වෙන්කළ ප්‍රතිපාදන (රු. මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැඩ නිමකළ ව්‍යාපෘති | සමස්ත භෞතික ප්‍රගතිය % | වියදම (රු. මි) | අනාගත බිල්පත් (රු. මි) | වියදම (රු. මි) | % |
| ***පළාත් සභා වෙනත් ප්‍රතිපාදන*** | | | | | | | | | |
| 1 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2.50 | 2 | 2 | 100 | 2.22 | - | 2.22 | 89 |
| ***මධ්‍යම රජයේ ප්‍රතිපාදන*** | | | | | | | | | |
| **එකතුව** | | 508.47 | 55 | 50 | 91 | 442.30 | 51.22 | 493.51 | 97 |
| **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** | | | | | | | | | |
| 1 | කෘෂිකර්ම රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන - සෞභාග්‍යා කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන | 259.15 | 9 | 9 | 100 | 257.40 | - | 257.40 | 99 |
| 2 | මුදල් අමාත්‍යාංශය - කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන | 135.03 | 9 | 9 | 100 | 135.03 | - | 135.03 | 100 |
| **සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව** | | | | | | | | | |
| 1 | පශු සම්පත් රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන | 63.23 | 16 | | 100 | 11.06 | 50.93 | 61.99 | 98 |
| 2 | සත්ව නිෂ්පාදන රේඛීය දෙපාර්තමේන්තුව | 3.12 | 3 | | 100 | 3.12 | - | 3.12 | 100 |
| 3 | මුදල් අමාත්‍යාංශය - කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන | 4.00 | 1 | | 100 | 4.00 | - | 4.00 | 100 |
| **වාරිමාර්ග දෙපාර්තමේනතුව** | | | | | | | | | |
| 1 | වාරිමාර්ග රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන - වාරි සෞභාග්‍යා | 43.95 | 17 | 12 | 85 | 31.70 | 0.28 | 31.98 | 72.77 |

## 1.5 අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා අංශ



# මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව



දැක්ම

ආහාර සුරක්ෂිතතාවයෙන් යුත් සෞභාග්‍යමත් මැදරටක්

**මෙහෙවර**

තිරසාර කෘෂිකර්ම ක්‍රම මගින් පළාතේ ආහාර නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩි කිරීම හා ඒ තුලින් ගොවි ජනතාවගේ ආදායම් තත්වය ඉහළ නැංවීම

## 2.1 ආයතනයේ ප්‍රධාන අරමුණු හා කාර්යයන්

I. කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණු කටයුතු

II. බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය

III. බෝග නිෂ්පාදනය වැඩි කිරීමට උචිත තාක්ෂණය ලබාදිම

IV. කෘෂි ව්‍යවසායකයන් දිරි ගැන්වීම

V. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ පරීක්ෂණ පැවැත්වීම

VI. ස්වාභාවික සම්පත් කළමනාකරණය

VII. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීම හා පරිසර හිතකාමී කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

VIII. ගොවීන්, ගෙවිලියන් හා තරුණ තරුණියන් සවිබල ගැන්වීම

IX. වගා නොකරන ඉඩම් වගා කිරීමට ගොවීන් පෙළඹවීම

X. ඵලදායිතාවය නැංවීම සඳහා කටයුතු කිරීම හා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

## 2.2 ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීම

දශක ගණනාවක් පුරා රටතුළ උද්ගතව පැවති ජන වාර්ගික අර්බුදයට පිළියමක් වශයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 13 වන සංශෝධනය එක් කිරීම හරහා එතෙක් මධ්‍යම රජය කේන්ද්‍ර කොටගෙන පැවති අධිකාරි බලය රටතුළ විමධ්‍යගත කෙරිණි. එම විමධ්‍යගත කරන ලද බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතිකරන ලද ආයතනික ව්‍යුහය වර්තමානයේ පළාත් සභාව නමින් හඳුන්වයි. ඒ අනුව ලංකාව පළාත් නවයකට වෙන්කර පළාත් සභා නවයක් ස්ථාපිත කෙරෙණි. ඉන් එකක් වනුයේ මධ්‍යම පළාත් සභාවයි. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව සෑම පළාත් සභාවකටම ප්‍රධාන අමාත්‍යාංශය ඇතුළුව අමාත්‍යාංශ පහක් බව සඳහන් කර ඇත. ඒ අනුව ස්ථාපිත කරන ලද මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගැනේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ පළමු ලැයිස්තුවේ සඳහන් වන පරිදි මධ්‍යම පළාතේ ගොවි ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නගා සිටුවීම සඳහා මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. ඒ අනුව මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ සැලසුම් සකස් කිරීම හා එම සැලසුම් ක්‍රියාවට නැංවීම, කෘෂිකාර්මික කටයුතුවල නිරතවී සිටින ජනතාවගේ සංවිධාන පිහිටුවීම හා එම සංවිධානවල බලතල තීරණය කිරීම, ඊට සම්බන්ධ අනුගාමී කරුණු සඳහා විධිවිධාන සකස් කිරීම වෙනුවෙන් මධ්‍යම පළාත් සභාව මගින් සම්මත කරන ලද 1990 අංක 11 දරණ ප්‍රඥප්තියෙන් මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බලය පවරා ඇත. එමගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ද විස්තර කර ඇත. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා ලැයිස්තුවේ පහත සඳහන් පරිදි කෘෂිකර්ම ක්ෂේත්‍රයේ බලය මධ්‍යගත කර ඇත.

- කෘෂිකර්මය, කෘෂිකර්ම ව්‍යාප්ති සේවාව, කෘෂිකර්ම ප්‍රවර්ධනය, කෘෂිකර්ම අධ්‍යාපනය හා කෘෂිකාර්මික සේවා
- ජාතික මට්ටමේ පර්යේෂණ ආයතන ලෙස නිර්දිෂ්ඨ ආයතනවලට නොගැනෙන පර්යේෂණ කටයුතු ඉටු කිරීම.

සමගාමී ලැයිස්තුව

- කෘෂිකර්මාන්තය පාදක කරගත් කර්මාන්ත ඇති කිරීම, ගොවිපලවල් ඇති කිරීම හා පෞද්ගලික පැළ තවාන් ඇති කිරීම.
- පාංශු සංරක්ෂණය
- පළිබෝධ පාලනය

මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 1989 දී ආරම්භ කර ඇත. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ධූරයක් ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුවේ ආරම්භක කෘෂිකර්ම අධ්‍යක්ෂ ලෙස රාජකරුණා දොළුවීර මහතා කටයුතු කර ඇති අතර දෙපාර්තමේන්තුවේ 12 වන පළාත් අධ්‍යක්ෂවරයා ලෙස වර්තමාන පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ පී.ආර්.පී.වයි. පල්ලේමුල්ල මහතා කටයුතු කරනු ලබයි.

පළාත් සභා ස්ථාපිත කිරීමට ප්‍රථම පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය යටතේ දිස්ත්‍රික්භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ මගින් කෘෂිකර්ම උපදේශ කොට්ඨාස පිහිටුවා කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ සහය ලබා ගනිමින් කෘෂි ව්‍යාප්ති කටයුතු පවත්වාගෙන යන ලදි. වර්තමානය වනවිට මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක තුන සඳහා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල පිහිටුවා එහි පරිපාලන නිලධාරියා ලෙස නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙක් පත්කර ඇත. පිළිවෙලින් මහනුවර දිස්ත්‍රික්කය සඳහා සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 04 ක් නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 04 ක් හා මාතලේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 03 බැගින් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 11 ක් පිහිටුවා ඇත. එම සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල සඳහා පත්කළ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ කෘෂිකර්ම උපදේශක කාර්යාල 90 ක් මගින් පළාතේ ගොවිජනතාව වෙත සේවය සපයනු ලැබේ.

එමෙන්ම දෙපාර්තමේන්තුව සතුව ගොවිපලවල් 4 ක් ක්‍රියාත්මක වන අතර එයින් විශාලම ගොවිපල නුවරඑළිය ගල්පාලම ගොවිපල වේ. උඩරට එළවළු හා බීජ අර්තාපල් නිෂ්පාදනය ගොවිපල තුළ සිදුකරයි. ගොවිපලෙහි වාර්ෂික ආදායම රුපියල් මිලියන 10ක් වේ. මීට අමතරව පලලේකැලේ ජනසවිගම පිහිටි ගොවිපල පටක රෝපණාගාරයක් ද සහිත ගොවිපලකි. .මෙහි පටක රෝපිත පලතුරු පැළ හා මල් පැළ නිෂ්පාදනය කරනු ලැබේ.

පල්ලේකැලේ ගොවිපල හැරුණු විට සෙසු ගොවිපලවල් පුහුණු මධ්‍යස්ථාන ලෙසද ක්‍රියාත්මක වන අතර තෘතීය හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාව හඳුන්වා දී ඇති කෘෂිකර්ම පුහුණු වැඩසටහන තුළින් වාර්ෂිකව NVQ Leval 4 සහතික ප්‍රතිලාභින් 90ක් පමණ බිහිකරයි. මොවුන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ස්වයං රැකියා හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සේවය සඳහා ක්ෂේත්‍ර සහයකයින් ලෙස යොදවන ලැබේ. 2020 වර්ෂයේදී මෙම කාර්යය Covid 19 වසංගත තත්වය හමුවේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ නමුත් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ලංකාවට අවශ්‍ය පාරිභෝගික ලොකු ළූණු හා ලොකුළූණු බීජ අවශ්‍යතාවයෙන් 40% ප්‍රමාණයක් මෙම දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදනය කරන අතර බීජ බෝංචි නිෂ්පාදනයෙන් ප්‍රමුඛයා බවට පත්වීමටද මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. එමෙන්ම දේශීය බීජ අර්තාපල් නිෂ්පාදනයෙහිලා හා පාරිභෝගික අර්තාපල් නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය තහවුරු කර ගැනිමට හැකිවීම දෙපාර්තමේන්තුව අත්පත් කර ගත් ජයග්‍රහණයන් වේ.

## 2.3 සංවිධානසටහන



පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ මහනුවර/මාතලේ/ නුවරඑළිය
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ මූලස්ථාන
ගණකාධිකාරි
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
කෘෂිකර්ම උපදේශක (මූලස්ථාන)
කෘෂිකර්ම උපදේශක (මූලස්ථාන)
පරිපාලන නිලධාරි
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි
විෂයභාර නිලධාරි
විෂයභාර නිලධාරි
සංවර්ධන නිලධාරි
කෘෂිකර්ම උපදේශක
සංවර්ධන නිලධාරි
මුදල් සහකාර
ප්‍රධාන කළමනාකරණ
කළමණාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
රියදුරු
රියදුරු
රියදුරු
රියදුරු
කාර්යාල කාර්ය සහයක
කාර්යාල කාර්ය සහයක
කාර්යාල කාර්ය සහයක
කම්කරු
කම්කරු
කම්කරු

## 2.4 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන ආයෝජනය හා ප්‍රාග්ධන ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | වෙන්වූ මුදල රු.මි. | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය රු.මි. | භෞතික ප්‍රගතිය % |
| 01 | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 100 | 86.2333 | 85.75 |
| 02 | මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වැඩසටහන් | | | |
| | සෞභාග්‍යා අතිරේක ආහාර භෝග වගා වැඩසටහන | 249.4 | 249.33 | 100% |
| | ව්‍යවසායකත්ව පොකුරු ගම්මාන වැඩසටහන අලුත්ගම දෙවන අදියර | 9.34 | 7.674 | 84% |
| | කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන | 135.05 | 135.05 | 100% |
| | පාංශු සංරක්ෂණ වැඩසටහන | 0.02 | 0.02 | 100% |
| | **එකතුව** | 493.81 | 478..3073 | |

## 2.5 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, 2020 වර්ෂයේ වියදම් සාරාංශය (ව්‍යාපෘති අනුව)

| අ. අ. | වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් වූ මුදල (රු.) | මූල්‍ය ප්‍රගතිය | | | | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| | | | සමුච්චිත වියදම ( රු.) | අතැති බිල්පත් (රු.) | මුළු වියදම (රු.) | මූල්‍ය ප්‍රගති ය % | |
| 1 | බිත්තර වී නිෂ්පාදන වැඩසටහන | 3,699,490.00 | 2,445,337.84 | 1,253,102.16 | 3,698,440.00 | 100% | 100% |
| 2 | බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන | 1,008,000.00 | 1,008,000.00 | - | 1,008,000.00 | 100% | 100% |
| 3 | බෝංචි බීජ නිෂ්පාදන වැඩසටහන | 515,000.00 | 513,022.00 | - | 513,022.00 | 100% | 100% |
| 4 | අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන | 1,180,000.00 | 859,766.50 | 319,805.00 | 1,179,571.50 | 100% | 100% |
| 5 | වී වගාවේ ඒකක නිෂ්පාදනය ඉහළ නැංවීමේ (යාය සංවර්ධන) වැඩසටහන | 3,007,000.00 | 2,855,854.95 | 150,140.00 | 3,005,994.95 | 100% | 100% |
| 6 | වන සත්ත්ව හානිවලින් වගා ආරක්ෂාකර ගැනීමේ වැඩසටහන | 15,822,156.00 | 15,668,306.00 | 147,275.00 | 15,815,581.00 | 100% | 100% |
| 7 | පලතුරු නිෂ්පාදන වැඩසටහන | 2,100,000.00 | 2,069,600.00 | 30,400.00 | 2,100,000.00 | 100% | 100% |
| 8 | පාංශු විද්‍යාගාර සංවර්ධනය හා නඩත්තුව | 1,000,000.00 | 696,754.40 | 303029.05 | 999783.45 | 100% | 100% |
| 9 | හායනයට ලක් වූ ඉඩම්වල පසේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රමය ආදර්ශනය කිරීමේ වැඩසටහන | 450,000.00 | 330,784.52 | 119,125.25 | 449,909.77 | 100% | 100% |
| 10 | වෙනස්වන කාලගුණික තත්ත්වවලට අනුගතවීමේ වැඩසටහන | 22,675,000.00 | 9,537,360.00 | 13,137,640.00 | 22,675,000.00 | 100% | 100% |
| 11 | උඩදුම්බර හෙළ බොජුන්හල වැඩිදියුණු කිරීම | 1,500,000.00 | 1,298,129.40 | 201,870.60 | 1,500,000.00 | 100% | 100% |
| 12 | GAP ගොවිපල් පිහිටුවීමේ වැඩසටහන | 3,000,000.00 | 2,244,679.95 | 755,310.05 | 2,999,990.00 | 100% | 100% |
| 13 | කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන | 3,600,000.00 | 2,654,670.00 | 937,977.50 | 3,592,647.50 | 100% | 100% |
| 14 | පර්යේෂණ හා ව්‍යාප්ති සංවාද වැඩසටහන | 60,000.00 | 59,999.50 | - | 59,999.50 | 100% | 100% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 15 | බෝග සායන වැඩසටහන | 256,510.00 | 256,400.00 | - | 256,400.00 | 100% | 100% |
| 16 | ආදර්ශන හා අත් හදා බැලීම් වැඩසටහන | 760,000.00 | 632,810.60 | 127,189.40 | 760,000.00 | 100% | 100% |
| 17 | නිලධාරි පුහුණු වැඩසටහන | 100,000.00 | 99,523.50 | - | 99,523.50 | 100% | 100% |
| 18 | කෘෂිකර්ම ක්ෂේත්‍ර සහකාර සහතිකපත්‍ර පාඨමාලාව (NVQ-Level iv) | 1,650,000.00 | 1,077,864.42 | 571,126.62 | 1,648,991.04 | 100% | 100% |
| 19 | බෝග නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා කෘෂි උපකරණ ලබා දීමේ වැඩසටහන | 3,375,844.00 | 2,954,189.28 | 399,387.50 | 3,353,576.78 | 99% | 100% |
| 20 | නවයාලතැන්න ගොවිපල හා පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | 1,000,000.00 | 517,715.51 | 482,100.04 | 999,815.55 | 100% | 100% |
| 21 | පල්ලේකැලේ ගොවිපල හා පටක රෝපණාගාරය සංවර්ධනය කිරීම | 1,250,000.00 | 853,807.60 | 396,188.00 | 1,249,995.60 | 100% | 100% |
| 22 | ගල්පාලම ගොවිපල හා පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | 2,900,000.00 | 2,044,668.05 | 855,271.95 | 2,899,940.00 | 100% | 100% |
| 23 | නාලන්ද ගොවිපල හා පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | 3,000,000.00 | 2,973,445.94 | 13,800.00 | 2,987,245.94 | 100% | 100% |
| 24 | මහනුවර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම | 7,941,000.00 | 1,647,311.60 | - | 1,647,311.60 | 21% | 100% |
| 25 | මුල්හාල්කැලේ කෘෂිකර්ම උපදේශක නිල නිවසය වලපනේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ලෙස නවීකරණය කිරීම (PSDG+CBG) | 11,563,600.00 | 2,045,821.54 | 1,611,978.71 | 3,657,800.25 | 32% | 100% |
| 26 | ග්‍රාමීය කෘෂිකර්ම උපදේශක නිල නිවස අලුත්වැඩියා කිරීම | 6,050,000.00 | 1,341,914.58 | 4,632,947.67 | 5,974,862.25 | 99% | 100% |
| 27 | පාලන වාර්තාව මුද්‍රණය කිරීම | 50,000.00 | 49,900.00 | - | 49,900.00 | 100% | 100% |
| 28 | කාර්යාල පහසුකම් වැඩිදියුදිණු කිරීම | 1,000,000.00 | 648,300.00 | 351,700.00 | 1,000,000.00 | 100% | 100% |
| 29 | ගොවි සවිය සඟරාව සඳහා දායකත්වය | 50,000.00 | 50,000.00 | - | 50,000.00 | 100% | 100% |
| | **එකතුව** | **100,563,600.00** | **59,435,937.68** | **26,797,364.50** | **86,233,302.18** | **85.75 %** | **100%** |

### 2.6 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2021 වර්ෂයේ සැලසුම්කරන ලද හා ඉටුකරන ලද කාර්යයන්

**1 බිත්තර වී නිෂ්පාදනය**
**වැයකළ මුදල -රු 3,698,440.00**

**අපේක්ෂිත අරමුණු**

- මධ්‍යම පළාත තුළ ගුණාත්මක බිත්තර වී භාවිතය සුළභ කිරීම තුළින් වී වගාවේ බිම් ඒකකයකින් ලැබෙන අස්වැන්න වැඩි කිරීම.
- වැඩි අස්වනු ලබාදෙන නව ප්‍රභේද ගොවින් අතර ප්‍රචලිත කිරීම හා තමන්ට අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය තමන් විසින්ම නිෂ්පාදනය කර ගැනීමට දිරි ගැන්වීම (ස්වයං බිත්තර වී නිෂ්පාදනය)
- ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනයට අවශ්‍ය තාක්ෂණික දැණුම හා අවශ්‍ය යෙදවුම් ලබා දීම .
- සුළු පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම .

| ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| බිත්තර වී ඇසුරුම් මලු නොමිලේ ලබාදීම | ඇසුරුම් මලු 29774 ක් ලබාදී ඇත |
| ස්වයං බිත්තර වී පැකට් ලබාදීම (නොමිලේ) | කි.ග්‍රෑ 02 පැකට් 2065 ක් හා කි.ග්‍රෑ 01 පැකට් 1540 ක් ලබාදී ඇත |
| බිත්තර වී ලබාදිම (50%) | බිත්තර වී බුසල් 768 ක් ලබාදී ඇත |
| බිත්තර වී පිරිසිදු කරන යන්ත්‍ර ලබාදිම (50%) | යන්ත්‍ර 7 ක් ලබාදී ඇත |
| මළු මහන යන්ත්‍ර ලබාදීම (50%) | යන්ත්‍ර 16 ක් ලබාදී ඇත |
| කමත් ආවරණ ලබාදිම (50%) | කමත් ආවරණ 23 ක් ලබාදී ඇත |
| පුහුණු හා ක්ෂේත්‍ර දින හා නාම පුවරු | පුහුණු 5 ක් ක්ෂේත්‍ර දින 1 ක් පවත්වා ඇත. නාමපුවරු 65 ක් ලබාදී ඇත. |






## 2 බීජ අර්තාපල් නිෂ්පාදනය

**වැයකළ මුදල - රු 1,008,000.00**

**අපේක්ෂිත අරමුණු**

- ඉහළ ගුණාත්වයෙන් යුත් බීජ අර්තාපල් සාධාරණ මිලකට ගොවින්ට ලබා දීම.
- ගොවින්ට අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් යුත් බීජ අර්තාපල් තම ක්ෂේත්‍රයේම නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දීම.
- ගොවින්ගේ සමාජ ආර්ථික තත්වය ඉහළ නැංවීම.
-

| ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| පෙරමූලික බීජ අර්තාපල් ලබාදීම (50%) | පෙර මූලික බීජ 300,000දී ඇත |
| බීජ ඇසුරුම් කූඩ ලබාදීම (50%) | බීජ ඇසුරුම් කූඩා 228 ලබා දීම |







***$G_0$ බීජ අර්තාපල් නිෂ්පාදනය - නුවරඑළිය***

## 3. බෝංචි බීජ නිෂ්පාදනය

**වැයකළ මුදල - රු 513,022.00**

**අපේක්ෂිත අරමුණු**

- බීජ බෝංචි ආනයනයට වැයවන විදේශ විනිමය අවම කිරීම.
- දෙපාර්තමේන්තු නිර්දේශිත බීජ හා විදේශවලින් ආනයනය කරන බීජ දේශීයව නිපදවා ගැනීම.
- ගොවින්ගේ සමාජ ආර්ථික තත්වය ඉහළ නැංවීම.

| ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| බෝංචි බීජ ලබාදීම | බීජ කිලෝ 66.5 ක් ලබාදී ඇත |
| බීජ ආමුකූලක ලබාදීම | බීජ ආමුකූලක පැකට් 250 ක් ලබාදී ඇත |
| වගා ආරක්ෂක උපකරණ ලබාදීම | වගා ආවරණ දැල් 40 ක් විදුලිවැට 25 ක් ලබාදී ඇත |
| ඇසුරුම් මළු ලබාදීම | ඇසුරුම් මළු 4000 ක් අදාළ ස්ටිකර් 4000 ක් ලබාදී ඇත |
| ආදර්ශන පැවැත්වීම | ආදර්ශන 46ක් පවත්වා ඇත |



නුවරඑළිය දිස්ත්‍රික්කය බෝංචි බීජ නිෂ්පාදන වැඩසටහන







## 4. අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන

**වැයකළ මුදල - රු 1,179,571,50**

**අපේක්ෂිත අරමුණු -**

- අතිරේක ආහාර බෝග බීජ අවශ්‍යතාවය දේශීයව නිෂ්පාදනය කර ගැනීම.
- ගුණාත්මක බීජ භාවිතයෙන් ඒකක අස්වැන්න වැඩි කිරීම.
- අතිරේක ආහාර බෝග ආනයනය සීමා කිරීම .

| ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| වගා ප්‍රවර්ධනය සඳහා බීජ ලබාදීම | |
| • බඩ ඉරිගු | බඩ ඉරිගු බීජ කි.ග්‍රෑ 484 ක් ලබාදී ඇත |
| • මුං | බීජ කි.ග්‍රෑ 550 ක් ලබාදී ඇත |
| • මිරිස් | MICH-HY බීජ කි.ග්‍රෑ 3 ක් අනිකුත් කි.ග්‍රෑ 34.5 ක් |
| • කුරක්කන් | බීජ කි.ග්‍රෑ 75 ක් ලබාදී ඇත |
| • කව්පි | බීජ කි.ග්‍රෑ 39.3 ක් ලබාදී ඇත |
| • රටකජු | බීජ කි.ග්‍රෑ 535 ක් ලබාදී ඇත |
| • උඳු | බීජ කි.ග්‍රෑ 40 ක් ලබාදී ඇත |
| | |
| බීජ නිෂ්පාදනය සඳහා බීජ ලබාදිම | |
| • මුං | බීජ කි.ග්‍රෑ 220 ක් ලබාදී ඇත |
| • කුරක්කන් | බීජ කි.ග්‍රෑ 37.5 ක් ලබාදී ඇත |
| • රටකජු | බීජ කි.ග්‍රෑ 1062 ක් ලබාදී ඇත |



මුං හා බඩ ඉරිඟු වගාව
දඹුල්ල කලාපය



5. වී වගාවේ ඒකක කේෂ්ත්‍රඵලයක නිෂ්පාදනය ඉහළ නැංවීම ( යාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම)

**වැයකළ මුදල - රු 3.005.994.95**

**අපේක්ෂිත අරමුණු**

- පැරශූට් තාක්ෂණය හඳුන්වාදීම තුලින් වී වගාවේ ඒකක කේෂ්ත්‍රඵලයක අස්වැන්න වැඩි කිරීම
- තාක්ෂණික පැකේජය (යාය එකට වගා කිරීම,කන්නයට වගා කිරීම,ගැඹුරට සී සෑම, ගුණාත්මක බිත්තර වී භාවිතය දිරි ගැන්වීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඇති කාබනික හා රසායනික පොහොර නිර්දේශ ගොවින් අතර ප්‍රචලිත කිරීම, ජල කළමනාකරණය, ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම භාවිතය හා ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය) ගොවින් අතර ප්‍රචලිත කිරීම ක්‍රියාත්මක කිරීම තුළින් වී වගාවේ ඒකක කේෂ්ත්‍රඵලයක අස්වැන්න ඉහළ නැංවීම හා ඒ තුලින් වී වගාවේන් ලබන ආදායම ඉහළ නැංවීම
- මෙහිදී තවාන් සකස් කර ගැනීම සඳහා පැරශූට් තැටි ලබාදීම මගින් වැය වන ශ්‍රම ඒකක ගණන අඩුකර ගැනීම. අවශ්‍ය වන බිත්තර වී ප්‍රමාණය අවම කර ගැනීම තුළින් ගුණාත්මක බිත්තර වී සඳහා වැය වන මුදල් අවම කර ගත හැක.

| ක්‍රියාත්මක කරනලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| බිත්තර වී ලබාදීම | බිත්තර වී බුසල් 321.5 ක් ලබාදී ඇත |
| වෙනත් යෙදවුම් ලබාදීම | කෘසර් පැකට් (ග්‍රෑම් 5) 172 ක් ලබාදී ඇත |
| පැරෂුට් තැටි ලබාදීම | තැටි 87823ක් ලබාදී ඇත |
| පුහුණු පැවැත්වීම | පුහුණු වැඩසටහන් 20 ක් පවත්වා ඇත |



*වගාව සඳහා සුදනම් තවානක්*
***දඹුල්ල කලාපය***



*පැරෂුට් තැටිවලට වී යෙදීම* ***උඩුනුවර යටිනුවර කලාපය***

## 6. වන සත්ව හානි වලින් වගාවන් ආරක්ෂා කර ගැනීම

**වැය කළ මුදල -රු. 15,815,581.00**

**අපේක්ෂිත අරමුණු**

- වන සත්ව හානි නිසා වගාවට සිදු වන හානි අවම කිරීම
- වගාවේ නිෂ්පාදනය හා ගුණාත්මය වැඩි කිරීම
- වන සත්ව හානි පාලනය සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීම,( සූර්යබල එනජයිසර්, ගැල්වනයිස්, වැට )

| ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| කෘෂි වැට ලබාදීම | කෘෂි වැට 2600 ක් ලබා දී ඇත |
| විදුලිවැට ලබාදීම | විදුලි වැට 767 ක් ලබා දී ඇත |

## 7. පලතුරු සංවර්ධන වැඩසටහන

**වැයකළ මුදල - රු. 2,100,000,00**

**අපේක්ෂිත අරමුණු**

- මධ්‍යම පළාත තුල හඳුනාගත් ප්‍රදේශවල ගුණාත්වයෙන් ඉහළ පලතුරු වගා කිරීම තුළින් පලතුරු වගා වපසරිය වැඩි කිරීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හඳුන්වා දී ඇති ගුණාත්වයෙන් ඉහළ නව ප්‍රභේද ගොවින්ට හඳුන්වාදීම තුළින් ඔවුන්ගේ ආදායම් තත්වය ඉහළ නැංවීම.
- දැනට අඩු අස්වනු ලබන පලතුරු වගා ක්ෂේත්‍ර පුනරුත්තාපනය කිරීම තුළින් අස්වනු ඉහළ නැංවීම.
- පාරිභෝගිකයන්ට ඉහළ ගුණාත්මයෙන් යුත් පලතුරු පරිභෝජනයට අවස්ථාව ලබා දීම.
- පෙර හා පසු අස්වනු හානි අවම කර වැඩි අස්වැන්නක් හා වැඩි මිලක් ලබා දීම තුළින් ගොවියාගේ ආර්ථික තත්වය ඉහළ නැංවීම.

| ක්‍රියාත්මක කරනලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | ප්‍රමාණය |
|---|---|---|
| පලතුරු පැළ ලබාදීම | පලතුරු පැළ 33361 ක් ලබාදී ඇත | |
| | නාරං පැළ | 2210 |
| | දොඩම් පැළ | 1112 |
| | දූරියන් පැළ | 630 |
| | රඹුටන් පැළ | 1177 |
| | අඹ පැළ | 1150 |
| | පටක රෝපිත කෙසෙල් පැළ(ඇම්බුන්) | 8232 |
| | පටක රෝපිත කෙසෙල් පැළ(කණ්ඩුල) | 2815 |
| | අලිපේර පැළ | 50 |
| | කොස් පැළ | 345 |
| | කටු අනෝදා පැළ | 915 |
| | පැපොල් පැළ | 5185 |
| | පැෂන් පැළ | 650 |
| | දෙළුම් පැළ | 10 |
| | දෙහි පැළ | 315 |
| | පේර පැළ | 6000 |
| | පෙයාර්ස් පැළ | 2515 |
| | ඇඹරුල්ලා පැළ | 50 |
| එල ආවරණ ලබාදිම | එල ආවරණ 500 | 500 |

***උඩුනුවර - යටිනුවර කලාපය***



වාණිජ පැෂන් වගාවක්



අඩු පරතර කෙසෙල් වගාවක්



පැපොල් වගාවක්

**8. ඛාදනයට ලක් වූ ඉඩම්වල පසේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඒකාබද්ධ ශාක පෝෂක කළමණාකරන වැඩසටහන් පැවැත්වීම.** වැයකළ මුදල - රු 449,909.77

**අපේක්ෂිත අරමුණු**

- ඒකාබද්ධ ශාක පෝෂක කළමණාකරන ක්‍රම භාවිතා කර වගාවන් කරගෙන ගොවීන් දිරිමත් කිරීමට ආදර්ශණ ක්‍රියාත්මක කිරීම.
- පස් පරීක්ෂා කර පොහොර යෙදීම දිරිමත් කිරීම තුළින් පස හා ජලය දූෂණය වීම අවම කිරීම හා පොහොර මිළදී ගැනීමට වැයවන අමතර මුදල් ඉතිරි කර ගැනීමට හැකි වීම.

| ක්‍රියාත්මක කරනලද ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| ඒකාබද්ධ ශාක පෝෂණ ආදර්ශන ක්‍රියාත්මක කිරීම | ආදර්ශන 83 ක් සිදුකොට ඇත |

**9. පාංශු විද්‍යාගාර සංවර්ධනය හා නඩත්තුව** වැයකළ මුදල - රු. 999,783.45

**අපේක්ෂිත අරමුණු**

- අවධිමත් රසායනික පොහොර භාවිතය නිසා පස නිසරු වීම වළක්වා ගැනීම හා ඒ සඳහා දැරීමට සිදුවන අමතර වියදම අඩු කිරීම හා එමගින් රසායනික පොහොර ආනයනය සඳහා වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනිමට හැකි වීම.
- වගා බිමේ පස පරීක්ෂා කර පොහොර නිර්දේශ ලබා ගැනීම තුළින් බෝගයට අවශ්‍ය පොහොර ප්‍රමාණය පමණක් යෙදීමට හැකිවීම.
- ප්‍රාදේශීයව පාංශු විද්‍යාගාර පිහිටුවීම තුළින් ගොවින්ට ඉතා පහසුවෙන් හා ඉක්මණින් පාංශු පරීක්ෂාව කර ගැනීමට අවස්ථාව ලබා දීම.

**ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්**

- පාංශු විද්‍යාගාර සඳහා උපකරණ මිලදී ගැනිම
- රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම
- විද්‍යාගාර අලුත්වැඩියාව

## 10 .වෙනස්වන කාලගුණ තත්ව වලට අනුගත වීම

**වැයකළ මුදල - රු. 22,657,000.00**

**අපේක්ෂිත අරමුණු**

- මධ්‍යම පළාත තුළ ආරක්ෂිත ගෘහ ලබා දීම තුළින් පළිබෝධ හානි වලින් ආරක්ෂා කර ගනිමින් ගුණාත්මයෙන් ඉහල අස්වැන්නක් ලබා ගැනීම.
- වැසි ආවරණ ලබා දීම තුළින් අහිතකර කාලගුණ තත්ව වලින් වගාවන් ආරක්ෂා කර ගනිමින් වගාවන් කර ගෙන යාමට ගොවීන් දිරිමත් කිරීම.
- මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කවල ජල පහසුකම් අඩු ප්‍රදේශවලට ජලය රැස්කර තබා ගැනීමට වැසි ජල ටැංකි ලබා දීම හා වගා ළිං ඉදිකරගැනිම සඳහා සානුබල දීමනා ලබා දීම.

| <u>ක්‍රියාත්මක කරනලද ක්‍රියාකාරකම්</u> | <u>භෞතික ප්‍රගතිය</u> |
|---|---|
| ආරක්ෂිත ගෘහ ඉදිකර ගැනීම | වර්ගඅඩි 500 ආරක්ෂිත ගෘහ 7<br>වර්ගඅඩි 1000 ආරක්ෂිත ගෘහ 60 |
| වැසි ආවරණ ඉදිකිරිම | වර්ගඅඩි 500 වැසි ආවරණ 11<br>වර්ගඅඩි 1000 වැසි ආවරණ 23 |
| කෘෂි ළිං ඉදිකිරීම | කෘෂි ළිං 27 |
| වැසිජල ටැංකි ඉදිකිරීම | ටැංකි 10 |



වැහි ජල ටැංකි
ඉදිකිරීම





ආරක්ෂිත ගෘහ ලබා දීම

## 11. උඩදුම්බර හෙල බොජුන්හල නවීකරණය

**වැයකළ මුදල - රු. 1,500,000.00**

**අපේක්ෂිත අරමුණු**

- ගොවි කාන්තාවන් සවි බල ගැන්වීම.
- දේශීය ආහාර භාවිතය තුළින් බෝ නොවන රෝග ඇතිවීම වළක්වා ගැනීම.
- සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීම.
- හෙල බොජුන්හලේ ජල ගැටළුවට විසඳුමක් ලෙස
- නල ළිඳක් ඉදිකිරීම මගින් ජල පහසුකම් ලබා දීම.
- සුළං බාධකයක් ඉදිකිරිම



උඩුදුම්බර හෙල බොජුන් හලේ ඉදිකරන ලද නල ළිඳ

## 12. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වා දීම

**වැයකළ මුදල - රු. 2,999,990,00**

**අපේක්ෂිත අරමුණු**

- අවිධිමත් පළිබෝධනාශක යෙදීම අවම කර ගනිමින් ගුණාත්මක ආහාර බෝග නිෂ්පාදනයට ගොවීන් හුරු කිරීම .
- පාරිභෝගිකයින්ට ගුණාත්මක ආහාර පරිභෝජනයට අවස්ථාව ලබා දීම.
- පරිසර හිතකාමී තිරසාර කෘෂිකාර්මික වගාවකට ගොවීන් හුරු කිරීම.

මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. කෘමි ප්‍රතිරෝධී දැල්, බෝග ආවරණ, පල ආවරණ,ඇතුළු කෘෂි යෙදවුම් ලබා දීම සිදු කරන ලදි.

| ක්‍රියාකාරකම් | ලබාදුන් ප්‍රතිලාභ | සංඛ්‍යාව |
|---|---|---|
| GAP ගොවිපල සඳහා උපකරණ ලබාදීම | ප්ලාස්ටික් කූඩ | 413 |
| | තවාන් තැටි | 661 |
| | ඇල්බට් සොලියුෂන් | 28 කි.ග්‍රෑ. |
| | ප්‍රෝටීන් ඇම | 7 |
| | පොලිතින් වසුන් | රෝල් 4 |
| | කෙසෙල් කැන් ආවරණ | රෝල් 23 |
| | ඵල ආවරණ | රෝල් 9 |
| | පැළ ආවරණ | රෝල් 49 |
| | සෙකටියර් | 2 |
| | UV ප්‍රතිරෝධී පොලිතින් | 900 |
| | උදලු තල | 16 |
| | දියර ඉසින යන්ත්‍ර | 20 |
| | කෘෂි වැට | 198 |
| | විදුලිවැට | 18 |
| | පළිබෝධනාශක ඇසුරුම් රාක්ක | 15 |
| | කෘමි ප්‍රතිරෝධක දැල් | දැල් ව.මී 27100 |
| | තණකොළ කපන යන්ත්‍ර | 16 |

පසු අස්වනු හානි අවම කිරීම සඳහා ප්ලාස්ටික් කූඩා ලබා දීම





ගුණාත්මක නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීම



වගා ආවරණය කිරීම හා පොල්තීන් වසුන් යෙදීම

## 13. කෘෂි ව්‍යාපාර සංවර්ධනය

**වැයකළ මුදල - රු. 3,592,647.50**

**අපේක්ෂිත අරමුණු**

- මධ්‍යම පළාත තුළ සුළු පරිමාණයෙන් පවත්වාගෙන යනු ලබන කෘෂි පාදක කර්මාන්ත වැඩි දියුණු කිරීම හා ස්වයං රැකියා උත්පාදනය සඳහා පහසුකම් ඇති කිරීම.

උදා - බිම්මල් නිෂ්පාදනය, ආරක්ෂිත ගෘහ තුල බෝග වගාව, මිරිස් කුඩු, හාල්පිටි වැනි නිෂ්පාදන,

මී මැසි පාලනය, ආහාර තාක්ෂණය හා අගය එකතු කළ නිෂ්පාදන ඇති කිරීම, පැළ තවාන් සංවර්ධනය

| ක්‍රියාකාරකම් | ලබාදුන් ප්‍රතිලාභ | සංඛ්‍යාව |
|---|---|---|
| කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම | මී මැසි පෙට්ටි | 128 |
| | මුහුණු ආවරණ | 21 |
| | දුම් විසුරුම් | 21 |
| | සෙවණ දැල් | ව.මී 1350 |
| | යූ වී ප්‍රතිරෝධි පොලිතින් | ව.මී 1900 |
| | බහුකාර්ය යන්ත්‍ර | 35 |
| | ඒකකාර්ය යන්ත්‍ර | 4 |
| | විදුලි තරාදි | 1 |
| | කොහුබත් කැට | 807 |
| | මඤ්ඤොක්කා පෙති කපන යන්ත්‍ර | 2 |
| | පොලිතින් සිලර් | 2 |
| | බිම්මල් මිශ්‍රණ පැකට් කරන යන්ත්‍ර | 7 |
| | බිම්මල් ජීවානුහරණ යන්ත්‍ර | 4 |
| | කෙසෙල් කැන් ආවරණ | 1000 |
| | බිත්තර වී මළු මහන යන්ත්‍ර | 1 |
| | කෘමි ප්‍රතිරෝධී දැල් | ව.මී 4206 |

## 14.පර්යේෂණ - ව්‍යාප්ති සංවාද පැවැත්වීම

**වැයකළ මුදල - රු. 59,999,50**

**අපේක්ෂිත අරමුණු**

- පර්යේෂණ අංශයේ නව සොයා ගැනීම් ගොවීන් වෙත සෘජුවම ලබා දීම.
- ගොවි ක්ෂේත්‍රවලදීම ගොවීන්ගේ ගැටලු පර්යේෂණ අංශයට යොමු කිරීම.

## 15 .බෝග සායන පැවැත්විම

**වැයකළ මුදල - රු. 256,400.00**

**අපේක්ෂිත අරමුණු**

- ගොවි ක්ෂේත්‍රවල ඇතිවන රෝග හා පළිබෝධ හානි සඳහා ප්‍රාදේශීය මට්ටමින් කඩිනම් විසඳුම් ලබා ගැනීමට අවස්ථාව සැලසීම.
- නිවැරදි තාක්ෂණික උපදෙස් ලබා ගැනීමට ගොවීන්ට මගපෙන්විම.

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| පෝස්ටර් හා අත් පත්‍රිකා මුද්‍රණය කර ලබා දීම | පෝස්ටර් හා අත් පත්‍රිකා මුද්‍රණය කර ලබා දී ඇත |

## 16. ආදර්ශණ හා අත්හදා බැලීම් ක්‍රියාත්මක කිරීම

**වැයකළ මුදල - රු. 760,000.00**

**අපේක්ෂිත අරමුණු**

- තාක්ෂණික ක්‍රමවේදවල යෝග්‍යතාව ක්ෂේත්‍ර මට්ටමින් අත්හදා බැලීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිපදවා ඇති නව ප්‍රභේද ,නව තාක්ෂණික දැනුම ගොවීන් අතරට සම්ප්‍රේෂණය කිරීම.

**අර්තාපල් බීජ නිෂ්පාදන වැඩසටහන - මුල්ගම**








**බිත්තර වී නිෂ්පාදන වැඩසටහන -**



## 17. නිලධාරී පුහුණු වැඩසටහන

**වැයකළ මුදල - රු. 99,523.50**

**අපේක්ෂිත අරමුණු**

- කාර්ය මණ්ඩල දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය තුළින් සේවාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

පළාත් තාක්ෂණ ක්‍රියාකාරී රැස්වීම් - 01 නිළධාරී පුහුණු වැඩසටහන් - 02

## 18 කෘෂිකර්ම කේෂෙත්‍ර සහකාර සහතික පත්‍ර පාඨමාලාව (NVQ –Level iv)

**වැයකළ මුදල - රු. 1,648,991.04**

මහනුවර දිස්ත්‍රික්කයේ නවයාලතැන්න දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේද, මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද පුහුණු මධ්‍යස්ථානයේද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගල්පාලම පුහුණු මධ්‍යස්ථානයේද කෘෂිකර්ම ක්ෂේත්‍ර සහකාර සහතික පත්‍ර පාඨමාලාව (NVQ –Level iv) ක්‍රියාත්මක කර ඇත. 2021 වර්ෂයේ පුහුණුලාභීන් 49 දෙනෙකු පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර ඇත.

**අපේක්ෂිත අරමුණු**

- මධ්‍යම පළාතේ පාසල් හැර ගිය තරුණ තරුණියන් අතර කෘෂිකර්මාන්තය ආකර්ශනීය වෘත්තියක් කර වීම.
- කෘෂිකර්ම ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා ශ්‍රමිකයන් බිහිකිරීම






කෘෂිකර්ම ක්ෂේත්‍ර සහකාර සහතික පත්‍ර පාඨමාළාව හැදෑරූ ළමුන් (NVQ –Level iv) ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සහතික ප්‍රදානෝත්සවයේ අවස්ථා

## 19. බෝග නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා කෘෂි උපකරණ ලබා දීමේ වැඩසටහන

**වැයකළ මුදල - රු. 3,353,576.78**

**අපේක්ෂිත අරමුණු**

- කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ගේ කෘෂි නිෂ්පාදන ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව ඉහළ නැංවීම හා ශ්‍රම වියදම අවම කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීම.

| ලබා දුන් කෘෂි උපකරණ | සංඛ්‍යාව |
|---|---|
| බිම්මල් මිශ්‍රණ පැකට් කිරීමේ යන්ත්‍ර | 06 |
| දියර ඉසින යන්ත්‍ර | 10 |
| කල්ටිවේටර් | 04 |
| පාංශු අවගාර | 03 |
| බිම්මල් ජීවානුහරණ යන්ත්‍ර | 03 |
| කප්පාදු කට්ටල | 16 |
| බිත්තර වී මලු මහන යන්ත්‍ර | 02 |
| පෙට්‍රල් ජල පොම්ප | 16 |
| කෘෂි වැට | 28 |
| විදුලි වැට | 92 |
| වල් කපන යන්ත්‍ර | 77 |
| වී වේලන ව්‍යුහ | 01 |

## 20. ගොවිපල සංවර්ධනය –

**වැයකළ මුදල - රු. 999,815.55**

**නවයාලතැන්න දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය**

**ඉටුකරන ලද කාර්යයන්**

- සෙවන ගෘහය හා ආරක්ෂිත ගෘහය අලුත්වැඩියා කිරීම
- ඇල්කතින් බට වල්කපන යන්ත්‍ර හා ආරක්ෂිත කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගෙන ඇත
- උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව සිදුකොට ඇත
- කෘෂි උපකරණ හා පොහොර මිලදීගෙන ඇත
- ගොවිපල සඳහා අවශ්‍යකරන රසායනික හා කාබනික පොහොර, ඇල්බට පොහොර, කැල්සියම් නයිට්‍රේට්, තවාන් තැටි, බද්ධ පළතුරු පැළ (දොඩම් පැළ,ජම්නාරං පැළ25) පටකරෝපිත කෙසෙල් පැළ,බීජ හා රෝපණ ද්‍රව්‍ය මිලදීගෙන ඇත

**පල්ලේකැලේ ගොවිපල හා පටක රෝපණාගාරය සංවර්ධනය**

**වැයකළ මුදල - රු. 1,249,995.60**

**ඉටුකරන ලද කාර්යයන්**

- පටකරෝපණාගාරය සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය රසායනික ද්‍රව්‍ය හා විද්‍යාගාර උපකරණ මිලදී ගෙන ඇත
- විදුලි උපකරණ වායු සමීකරණ යන්ත්‍රය හා ප්‍රොපගේටරය අලුත්වැඩියාව සිදුකොට ඇත
- ගොවිපල අංශයේ සාමාන්‍ය කටයුතු සඳහා අවශ්‍යවන යෙදවුම් මිලදීගෙන ගොවිපල සංවර්ධනය කර ඇත

**නාලන්ද දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය**

**වැයකළ මුදල - රු. 2,987,245.94**

**ඉටුකරන ලද කාර්යයන්**

- මහ කන්නය සඳහා වගා කටයතු සිදු කරමින් පවති.
- පැපොල් අක්කර 1/4 ක් , කෙසෙල් අක්කර 1/2 හා පැෂන් අක්කර 1/4 වගා කර ඇත.
- ගොවිපළ ඉදිරිපස වැට ඉදි කිරීම.
- කාර්යාලය අලුත්වැඩියාව.
- වැසි ආවරණයක් ඉදි කිරීම.
- නේවාසිකාගාරය අලුත්වැඩියාව.
- කමත කොන්ක්‍රීට් කිරීම.

**ගල්පාලම දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය**

**වැයකළ මුදල - රු. 2,899,940.00**

**අපේක්ෂිත අරමුණු**

- ආදර්ශ ගොවිපලක් ලෙස නවිකරණය කිරීම.
- ප්‍රදේශයට අවශ්‍ය බීජ අර්තාපල් නිෂ්පාදන
- ගුණාත්මයෙන් ඉහල $G_0$ බීජ අර්තාපල් නිෂ්පාදනය



සංවර්ධනය කරන ගද පල්ලේකැලේ පටක රෝපනාගාරය





**ගොවිපල සංවර්ධනය**



සංවර්ධනය කරන ලද ගල්පාලම දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය





සංවර්ධනය කරන ගද නාලන්ද දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය

## 21 .සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලය නවීකරණය

**1. ගැටඹේ , පේරාදෙණිය පිහිටි නිල නිවාසය මහනුවර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලය ලෙස නවිකරණය කිරීම**

වෙන් කළ මුදල රු. 7,941,000.00 වැයකළ මුදල - රු. 1,647,311.00

**2' මුලහල්කැලේ කෘෂිකර්ම උපදේශක නිල නිවාසය වලපනේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලය ලෙස නවීකරණය කිරීම**

වෙන් කළ මුදල රු. 11,563,600.00 වැයකළ මුදල - රු. 3,657,800.00

**අපේක්ෂිත අරමුණු**

- සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාල සඳහා කාර්යාල පහසුකම් සහ මහජනතාව වෙත සැලසෙන සේවාවේ ගුණාත්මය ඉහල නැංවීම.

## 22. කෘෂිකර්ම නිල නිවාස අලුත්වැඩියා කිරීම (නමදගල,දඹුල්ල, ගලේවෙල, කිඹිස්ස)

**වැයකළ මුදල - රු. 5,974,862.00**

**අපේක්ෂිත අරමුණු**

- මධ්‍යම පළාත තුල පවතින නිලනිවාස බොහොමයක් මේ වන විට භාවිතා කල නොහැකි මට්ටමකට අබලන්ව ඇත. එබැවින් තෝරාගත් නිල නිවාස කිපයක් අළුත්වැඩියාව තුලින් නිලධාරීන්ගේ නිල නිවාස අවශ්‍යතාවය සපුරා ගැනිමටත් සේවාවේ ගුණත්වය ඉහළ නැංවීම
- මෙම ගෙඩනැගිලි වල පැවැත්ම ආරක්ෂා කර ගැනිම

## 23. පාලන වාර්තාව සම්පාදනය

**වැයකළ මුදල - රු. 4දවඝද9,900.00**

**අපේක්ෂිත අරමුණු**

2020 වර්ෂයේ පළාත තුල සංවර්ධන වැඩසටහන් වලට අදාලව ප්‍රගතිය සැකසීම සඳහා පාලන වාර්තාව මුද්‍රණය කිරීම.

2021 වර්ෂයේ මධ්‍යම පළාත තුල ක්‍රියාත්මක වැඩසටහන් වල හා තාක්ෂණික දැනුවත් කිරීම් ගොවින් වෙත සම්ප්‍රේෂණය සඳහා ගොවි සවිය සඟරාව මුද්‍රණය කිරීම

## 24. කාර්යාල පහසුකම් වැඩි දියුණු කිරීම

**වැයකළ මුදල - රු. 1,000,00.00**

**අපේක්ෂිත අරමුණු**

- මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් කෘෂිකර්ම උපදේශක කාර්යාල, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාල හා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලවල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැණිම
- නිලධාරීන්ට යහපත් මානසික වටපිටාවක් තුල කාර්යක්ෂම සේවාවක් ලබා දීමට හැකිවීම

## 2.7 මධ්‍යම රජයේ වැඩසටහන්

### 2.7.1 කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය | | භෞතික ප්‍රගතිය % | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | විශේෂ කරුණු / සටහන |
|---|---|---|---|---|---|---|---|
| | | | රු.මි | % | | | |
| ස්වයං කාබනික පොහොර නිශ්පාදකයින්ට උපකරණ ලබාදීම | උදලුමුල්ලු, වීල්බැරෝ, සවල්, රබර් හෝස්, ඇතුළු උපකරණ කට්ටල 5350 ක් හා කළු පොලිතීන්, කි. ග්‍රෑ.2985 | 60.36 | 60.36 | 100% | 100% | 5350 | උපකරණ මිල දී ගෙන ඇත. ප්‍රතිලාභීන් වෙත නිකුත් කර ඇත |
| කාබනික පොහොර ඇසුරුම් ගෘහ ඉදිකිරීම | ගෘහ 45 ක් ඉදිකිරීම. එක් ගෘහයක් වෙනුවෙන් රු. 200,000/= බැගින් දිරි දීමනා ගෙවීම (සානුබල දීමනා) | 9.00 | 9.00 | 100% | 100% | 45 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත |
| මධ්‍ය හා මහා පරිමාණ නිශ්පාදකයින්ට අවශ්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා 50% ගොවි දායකත්වය හෝ රු. 270,000/= බැගින් සානුබල දීමනා ලබාදීම | කුඩා පරිමාණ කැබලි කරන යන්ත්‍ර, කොම්පොස්ට් හලන යන්ත්‍ර .මළු මහන යන්ත්‍ර ලබා දීම වල් කලන යන්ත්‍ර ලබා දීම | 10.17 | 10.17 | 100% | 90% | 100 | උපකරණ මිල දී ගෙන ඇත |
| නුවරඑළිය හා නාලන්ද පිහිටි පාංශු පරීක්ෂණාගාර 02 ට හා මහනුවර ඉදිකරන පාංශු පරීක්ෂණාගාර සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම | කොම්පෝස්ට් පරීක්ෂා කිරීමට අවශ්‍ය උපකරණ මිල දී ගැනීම | 46.71 | 46.71 | 100% | 50% | | උපකරණ මිල දී ගෙන ඇත |
| නාලන්ද ගොවිපලේ කාබනික පොහොර ඒකකය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීම | කැබලි කරන යන්ත්‍ර, මිශ්‍ර කිරීමේ යන්ත්‍ර, යාන්ත්‍රික සල්ලඩ, අමුද්‍රව්‍ය, පොලිතීන්, ERP ඇතුළු උපකරණ මිල දී ගැනීම, කාබනික පොහොර ගෘහය, ඉදිකිරීම | 3.79 | 3.79 | 100% | 100% | | කාබනික පොහොර ගෘහයේ වැඩ අවසන් කර ඇත. උපකරණ හා යෙදවුම් මිල දී ගෙන ඇත |
| රයිසෝබියම් බීජ ආමුකුලක ලබා දීම | ග්‍රෑම් 100 රයිසෝබියම් බීජ ආමුකුලක පැකට් නොමිලේ ලබා දීම | 1.08 | 1.08 | 100% | 100% | 500 | පැකට් 7205 මුලික අධ්‍යයන ආයතනයෙන් ලබාගෙන ප්‍රතිලාභීන් වෙත නිකුත් කර ඇත |
| මාශ බෝග බීජ සැපයීම | ගොවීන් සඳහා 50% ගොවි දායකත්වය යටතේ මාශ බෝග බීජ සැපයීම | 0.50 | 0.50 | 100% | 100% | | මුං බීජ කිලෝ 19.5, බෝංචි බීජ කිලෝ 320, මෑ බීජ කිලෝ 30 මිල දී ගෙන ගොවීන්ට ලබා දී ඇත |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | 03 | 0.05 | 0.05 | 100% | 100% | 500 | පුහුණු වැඩසටහන් 03 ක් පවත්වා ඇත |
| නාලන්ද ගොවිපල සඳහා රෝද හතර ට්‍රැක්ටරයක් මිල දී ගැනීම | 01 | 3.40 | 3.40 | 100% | 100% | | රෝද හතර ට්‍රැක්ටරයක් මිල දී ගෙන ඇත |
| **එකතුව** | | **135.05** | **135.05** | **61%** | **100%** | **6495** | |

**වැය කළ මුදල රු - මිලියන 135.05**

**අපේක්ෂිත අරමුණු**

ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් අනුව "දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථිකයක් සඳහා පරිසර හිතකාමී වගාව සිදු කිරීමේ" ප්‍රතිපත්තිය යටතේ මධ්‍යම පළාත තුළ කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම හා භාවිතය දිරිගැන්වීම.

- ස්වයං කාබනික පොහොර නිෂ්පාදකයින් ,මධ්‍ය හා මහා පරිමාණ නිශ්පාදකයින්ට කාබනික පොහොර නිශ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් හා උපකරණ ලබා දීම.
- පාංශු පෝෂකත්වය වැඩි කිරීම සඳහා නයිට්‍රජන් තිරකරන මාෂ බෝග වගාව දිරිමත් කිරීම හා රෛසෝබියම් ආමුකුලක ලබා දීම .
- නාලන්ද ගොවිපල ආදර්ශමත් කාබනික පොහොර නිශ්පාදන ඒකකයක් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම .
- ගොවීන් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීම හා කාබනික පොහොර නිශ්පාදනය කරන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ගුණාත්මක කාබනික පොහොර නිෂ්පාදනයට දිරිගැන්වීම.
- කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම

| ව්‍යාපෘතිය | වියදම් කල මුදල රු.මි | ලබාදුන් ප්‍රතිලාභ |
|---|---|---|
| ස්වයං කාබනික පොහොර නිෂ්පාදනය සඳහා උපකරණ ලබාදීම | 60.36 | උදලු මුල්ලු, සවල්, විල්බැරෝ, තාච්චි ඇතුලත් උපකරණ කට්ටල 5350<br>කලු පොලිතින් කිලෝ 2985 |
| කාබනික පොහොර නිෂ්පාදන ගෘහ ඉදිකිරීම | 9.0 | ගෘහ 45 ක් ඉදිකිරීම |
| මධ්‍ය හා මහා පරිමාණ කාබනික පොහොර නිෂ්පාදකයින් සඳහා උපකරණ ලබාදීම | 10.17 | කොම්පෝස්ට් කැබලි කරන යන්ත්‍ර (විදුලි) -37, කොම්පෝස්ට් කැබලි කරන යන්ත්‍ර (පෙට්‍රල්) -05, කොම්පොස්ට් හලන යන්ත්‍ර - 09, වල් කපන යන්ත්‍ර -90, මළු මහන යන්ත්‍ර -40 |
| කාබනික පොහොර ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා විද්‍යාගාර පිහිටුවීම | 46.71 | Analytical Balance – 03<br>Top pan balance – 01<br>Bench Top pH meter – 01<br>Conductivity meter – 01<br>Water Distillation unit – 01<br>Flame photometer – 01<br>Electric shaker – 01<br>Spectrophotometer – 01<br>Hot plate with stirrer – 01<br>Stainless Steel sieve - 2mm – 01<br>Stainless Steel sieve - .5mm - 01<br>Laboratory working Bench – 01<br>Fume Hood (Acid digestion) – 03<br>Ceramic Mortar & Pestle - 03<br>Kjeldhal Distillation unit - 03<br>Digestion Block - 03<br>Muffle Furnace - 03<br>Electric Oven - 03<br>Steam bath/Water bath - 03 |
| නාලන්ද ගොවිපලේ කාබනික පොහොර නිෂ්පාදන ඒකක පිහිටුවීම | 3.79 | කොම්පෝස්ට් කැබලි කරන යන්ත්‍ර 1, මිශ්‍රකිරීමේ යන්ත්‍ර 1, යාන්ත්‍රික සල්ලඩ 1, උදලු මුල්ලු 4, සවල් 5, උදලු තල 2, රබර් හෝස් 1,පොලිතින් කිලෝ 159, රබර් බූට්ස් ජෝඩු 5,ග්ලව්ස් ජෝඩු 10, රොක් පොස්පේට් කිලෝ 5000, කුකුළු පොහොර කිලෝ 1500, ගොම කියුබ් 13 |
| නයිට්‍රජන් පෝෂක තිර කිරීමට මාශ බෝග බීජ සඳහා - රෛසෝබියම් ආමුකුලක හදුන්වා දීම | 1.08 | ග්‍රෑම් 100 බීජ ආමුකුලක පැකට් 7205 |
| අතරමැදි කන්නයේ වගාව සඳහා රනිල බෝග හදුන්වාදිම | 0.5 | මුං බීජ කිලෝ 19.5<br>බෝංචි බීජ කිලෝ 320<br>මෑ බීජ කිලෝ 30 |
| පුහුණු වැඩසටහන් | 0.5 | පුහුණු වැඩසටහන් 3 |
| නාලන්ද ගොවිපලට සිව්රෝද ට්‍රැක්ටරයක් මිලදී ගැනිම | 3.4 | සිව්රෝද ට්‍රැක්ටර 1 |

# කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන



මධ්‍ය හා මහා පරිමාණ කාබනික පොහොර නිෂ්පාදකයන්ට උපකරණ ලබා දීම



නාලන්ද ගොවිපල කාබනික පොහොර සැකසුම් ඒකකයට අවශ්‍ය උපකරණ ලබා දීම








කාබනික පොහොර සැකසුම් ගෘහ ලබා දීම







මධ්‍යම පලාත් ගරු ආන්ඩුකාරවර ලලිත් යු ගමගේ මැතිතුමා කාබනික පොහොර නිෂ්පාදන ඒකක පරීක්ෂාව



ආන්ඩුකාරවර ලලිත් යු ගමගේ මැතිතුමා සහභාගි වූ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය සම්බන්ධව ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන - තලාතුඔය









මධ්‍යම පළාත තුළ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය සම්බන්ධ උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කිරීමේ වැඩසටහන - මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

## 2.7. 2 සෞභාග්‍යා අතිරේක ආහාර බෝග සංවර්ධන වැඩසටහන -සාරාංශය

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තු මුදල රු. | සමුච්චිත වියදම රු. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | වී වගා යාය සංවර්ධන වැඩසටහන | 7.98 | 7.98 | 100% | 100% |
| 2 | අර්තාපල් වගා ප්‍රවර්ධනය වැඩසටහන | 36.6 | 36.6 | 100% | 100% |
| 3 | මිරිස් වගා ප්‍රවර්ධනය වැඩසටහන | 8.6 | 8.36 | 100% | 100% |
| 4 | බඩඉරිඟු වගා ප්‍රවර්ධනය වැඩසටහන | 3.28 | 3.28 | 100% | 100% |
| 5 | කුරක්කන් වගා ප්‍රවර්ධනය වැඩසටහන | 1.02 | 0.97 | 100% | 100% |
| 6 | ලොකු ළූණු වගා ප්‍රවර්ධනය වැඩසටහන | 191.3 | 191.3 | 100% | 100% |
| 7 | මුං වගා ප්‍රවර්ධනය වැඩසටහන | 0.77 | 0.77 | 100% | 100% |

වැය කල මුදල - රු - මිලියන 249.33

සෞභාග්‍යා ජාතික ආහාර බෝග සංවර්ධන වැඩසටහන යටතේ බෝග 07 ක සංවර්ධනය සඳහා රෝපන ද්‍රව්‍ය "බිජ හා වෙනත් සැපයුම් ද්‍රව්‍ය ලබා දිම සිදු කරන ලදි .

01 වි වගා යාය සංවර්ධනය - රු - මිලියන 7.98

අපේක්ෂිත අරමුණු

- වි වගාවේ අස්වැන්න වැඩි කර නිෂ්පාදන වියදම අවම කිරිම සදහා කාබනික පොහොර භාවිතය හා ගැඹුරට සි සෑම දිරි ගැන්විම.
- ස්වයං බිත්තර වි නිෂ්පාදනය සදහා ගොවින් ගේ ඉල්ලුම පවතින හා නව වි ප%භේදවලින් තෝරා ගත් ප්‍රභේද කිපයකින් කිලෝ ගෑම් 02 බැගින් ලබා දීම.
- ශ්‍රම හිගයට විසදුමක් ලෙස පැරෂුට් තාක්ෂණය හදුන්වා දිම.

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| බිම් සැකසීම සඳහා මුදල් ලබාදීම | අක්කර 350 |
| කාබනික පොහොර ලබාදීම | අක්කර 397 |
| පැරෂුට් තැටි ලබාදීම | පැරෂුට් තැටි 95,336 |
| බිත්තර වි ලබාදීම | ස්වයං බිත්තර වී නිෂ්පාදනය සඳහා ( කි.ග්‍රෑ. 1හා කි.ග්‍රෑ. 2) බිත්තර වී පැකට් 300 |
| පුහුණු හා කේෂ්ත්‍ර දින පැවැත්වීම | පුහුණු 20 හා ක්ෂේත්‍ර දින 09 |

02. අර්තාපල් වගා ප්‍රවර්ධනය **- රු. මිලියන 36.6**

**අපේක්ෂිත අරමුණු**

- මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල දැනට අර්තාපල් වගාව නොකරන ප්‍රදේශ වලට අර්තාපල් වගාව හඳුන්වාදීම සඳහා ආනයනික හා දේශිය ප්‍රබේද වල බිජ ලබා දිම.
- කාබනික පොහෙර භාවිතය දිරිගැන්විම සඳහා මුල්‍යාධාර ලබා දිම.
- සුළගින් වගාවට වන හානි අවම කිරීම සඳහා සුලං ආවරණ දැල් ලබා දිම .
- නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවත්නා වගා වපසරිය වැඩි කිරිම සඳහා බිජ අර්තාපල් විදුලි වැට හා ක්ෂුද්‍ර ජල සම්පාදන ජල පද්ධති ලබා දිම.

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| ස්වයං බීජ අර්තාපල් නිෂ්පාදනය සදහා පෙර මූලික බීජ ලබාදීම | $G_0$ බීජ අර්තාපල් 600,000 |
| බීජ අර්තාපල් මිලදී ගැනීම හා බෙදාහැරීමේ සමුපකාර සමිති සංවර්ධනය | සමිති 06 |
| නව ප්‍රදේශ සදහා බීජ අර්තාපල් නොමිලේ ලබාදීම | සැෂි හා ග්‍රැනෝලා ප්‍රභේදවලින් හොන්ඩර 1000 ක් ගොවීන් 250 දෙනෙකු වෙත ලබා දී ඇත. |
| නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීමට අදාළ උපකරණ ලබාදීම | ක්ෂුද්‍ර ජලසම්පාදන කට්ටල 72 හා විදුලි වැට 737 ක් ලබා දීම |

3. මිරිස් වගා ප්‍රවර්ධනය - රු. මිලියන 8.36

අපේක්ෂිත අරමුණු

- මධ්‍යම පළාතේ මිරිස් වගාව ප්‍රචලිත කිරීම හා නව ප්‍රභේද ප්‍රචලිත කිරීම අරමුණු පෙර දැරි කරගෙන මිරිස් බීජ ලබා දිම. (MICH 1 )
- ජල සම්පාදන කටයුතු සඳහා විසුරුම් ජල සම්පාදන පද්ධති ලබා දිම.

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| දෙමුහුම් මිරිස් බීජ ලබාදීම | මිරිස් බීජ කි.ග්‍රෑ 53 |
| විසුරුම් ජල සම්පාදන පද්ධති ලබාදීම | අක්කර 1/4 කට්ටල 128<br>අක්කර 1/2 කට්ටල 1<br>අක්කර 1 කට්ටල 2<br>අගල් 2 විදුලියෙන් ක්‍රියාකරන පොම්ප 7<br>අගල් 1 විදුලියෙන් ක්‍රියාකරන පොම්ප 2<br>අගල් 2 ඉන්ධන මගින් ක්‍රියාකරන පොම්ප 4 |

04. බඩ ඉරිගු වගා ප්‍රවර්ධනය - රු. මිලියන 3.28

අපේක්ෂිත අරමුණු

- යල හා මහ කන්නවල වගාව සඳහා නව වැඩි දියුණු කළ දෙමුහුම් ප්‍රභේද හඳුන්වා දීම
- ඵලදායිතාවය ඉහළ නැංවිම සඳහා ආදර්ශන පවත්වාගෙන යාමට අවශ්‍ය බීජ හා යෙදවුම් ලබා දීම

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| මහ කන්නයේ ඉහළ අස්වනු ආදර්ශන පැවැත්වීම | ආදර්ශණ 5 |
| වගා ප්‍රවර්ධනය සඳහා දෙමුහුන් බීජ ලබාදීම | පැසිපික් බීජ කි.ග්‍රෑ 2740<br>ජෙට් බීජ කි.ග්‍රෑ 700 |
| කුඹුරු ඉඩම්වල ඉහළ අස්වනු ආදර්ශනපැවැත්වීම | ආදර්ශණ 10 |
| අස්වනු සමීක්ෂණ පැවැත්වීම | අස්වනු සමීක්ෂණ 25 |

05. මුං වගා ප්‍රවර්ධනය  - රු. මිලියන 0.77

මුං වගාව වපසරිය වැඩි කිරීම සඳහා  බීජ ලබා දීම .

| **ක්‍රියාකාරකම්** | **ප්‍රගතිය** |
|---|---|
| වගා ප්‍රවර්ධනය සඳහා බීජ ලබාදීම | මුං බීජ  කි.ග්‍රෑ 1879 |
| අතරමැදි කන්නයේ මුං වගාව සඳහා ආදර්ශණ සිදුකිරීම | ආදර්ශන 15 |

06. කුරක්කන් වගා ප්‍රවර්ධනය  - රු. මිලියන 0.97

අපේක්ෂිත අරමුණු

- කුරක්කන් වගා වපසරිය වැඩි  කිරීම.
- පැරෂුට් තාක්ෂණය භාවිතයෙන් පැළ සිටුවීම ගොවින් අතර ප්‍රචලිත කිරීම.
- කුරක්කන් බීජ වෙන් කිරීම සඳහා යන්ත්‍ර ලබා දීම.

| **ක්‍රියාකාරකම්** | **ප්‍රගතිය** |
|---|---|
| වගා ප්‍රවර්ධනය සඳහා බීජ ලබාදීම | බීජ  කි.ග්‍රෑ 755.5 |
| පැළ සිටුවීමේ ප්‍රවර්ධනය සඳහා බීජ ලබාදීම | බීජ  කි.ග්‍රෑ 274.6 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු 10 |

07. ලොකු ළූණු වගා ප්‍රවර්ධනය  - රු. මිලියන 191.36

අපේක්ෂිත අරමුණු

- මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ලොකු ලුණු වගාවේ ඵදායිතාව ඉහල නැංවීම  සඳහා  අවශ්‍ය ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති  ලබා දීම.
- වගා ආවරණට අවශය පොලිතින් ලබා  දීම.
- එසේම බීජ නිෂ්පාදනයට අවශ්‍ය  මව් බල්බ  ප්‍රවාහනය වැඩි කර ගැනීමට  කිලෝග්‍රෑමයට රු 125 බැගින් සහනධාරයන් ගොවින්ට දීම.

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| නිෂ්පාදන ඵලදායිතාවය වැඩිකිරීම සඳහා බිංදු ජල සම්පාදන පද්ධති ලබාදීම | අක් 1/4 ජල සම්පාදන පද්ධති 540 ක්  අක් ½ ජල සම්පාදන පද්ධති 157 ක් ලබාදී ඇත |
| බීජ නිෂ්පාදනයට යොදාගන්නා වැහි ආවරණ අලුත්වැඩියාව සඳහා පොලිතින් ලබාදීම | වැහි ආවරන 64 ක් අලුත්වැඩියාව |
| අලුතින් වැහි ආවරණ ඉදිකිරීම සඳහා පොලිතින් ලබාදීම | පොලිතින් කිලෝ 5000 ක් ලබාදී ඇත |
| බීජ නිෂ්පාදනය සඳහා මව් බල්බ තබාගැනීම වෙනුවෙන් සහනාධාර ලබාදීම | මව්බල්බ 100000 ක් නොමිලේ ලබාදීම |
| පුහුණු හා ක්ෂේත්‍ර දින පැවැත්වීම | පුහුණු වැඩසටහන් 16 |

### 2.7. 3 ව්‍යවසායකත්ව පොකුරු ගම්මාන සංවර්ධන හා අගයදාම සංවර්ධන වැඩසටහන- අළුත්ගම

| වැඩසටහන | විස්තරය | වෙන් කළ මුදල (රු.මි) | වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % | වෙනත් |
|---|---|---|---|---|---|---|
| ව්‍යවසායකත්ව පොකුරු ගම්මාන සංවර්ධන හා අගයදාම සංවර්ධන වැඩසටහන | ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති පිහිටුවීම (30% ගොවි දායකත්වය) | 8.16 | 7.02 | 86% | 100% | ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති 60 ක් ලබා ගෙන ඇත |
| | ඩිජිටල් තරාදි නොමිලේ ලබා දීම | 0.2 | 0.17 | 84% | 100% | ඩිජිටල් තරාදි 07 ක් ලබා දී ඇත |
| | ඩෙසිකේටර් නොමිලේ ලබා දීම | 0.5 | 0.25 | 50% | 100% | ඩෙසිකේටර් 60 ක් ලබා දී ඇත |
| | පුහුණු වැඩසටහන් | 0.25 | 0.25 | 100% | 100% | පුහුණු වැඩසටහන් පවත්වා ඇත |
| | පරිපාලන වියදම් | 0.23 | 0.19 | 83% | 100% | |
| | **එකතුව** | **9.34** | **7.87** | **84%** | | |

2021 වර්ෂයේ නාවලපිටිය- අළුත්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ආරක්ෂිත ගෘහ තුල MICH 1 දෙමුහුන් මිරිස් බීජ නිෂ්පාදනය ගොවීන් 24 දෙනෙකු සම්බන්ධ කරගෙන සිදුකරන ලදී. මෙම වැඩසටහන යටතේ මේ වන විට ඔවුන් MICH මිරිස් බීජ කිලෝ 300 පමණ නිෂ්පාදනය කර ඇත. බීජ සහතික කිරීමේ සේවය සමග ඒකාබද්ධව ගුණාත්මය සහතික කරන ලද බීජ අලෙවි කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

මෙම වැඩසටහනේ දෙවන අදියර ලෙස නාවලපිටිය, දෙකිද, දඩුබැදිරුප්ප ග්‍රාම නිලධාරී කොට්ඨාශවල ආරක්ෂිත ගෘහ 60ක් තුළ MICH 1 මිරිස් බීජ ඇතුළු බීජ නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**අපේක්ෂිත අරමුණු**

- ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති, ඩෙසිකේටර්, ඩිජිටල් තරාදි ලබා දීම මගින් දේශීය දෙමුහුන් බීජ නිශ්පාදන වැඩසටහන් දිරිගැන්වීම තුළින් බීජ අවශ්‍යතාව සුලභ කිරීම .

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති පිහිටුවීම | ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති 60 |
| ඩිජිටල් තරාදි ලබාදීම | ඩිජිටල් තරාදි 07 |
| ඩෙසිකේටර් ලබාදීම | ඩෙසිකේටර් 60 |
| පුහුණුතු වැඩසටහන් | පුහුණු වැඩසටහන් 31 |

### 2.7. 4 පාංශු සංරක්ෂණ වැඩසටහන  2021-12-31 දිනට ප්‍රගතිය

**වැය කළ මුදල- රු. 200,000.00**

මහනුවර දිස්ත්‍රික්කයේ මාරස්සන කෘෂිකර්ම උපදේශක කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලදී.

**අපේක්ෂිත අරමුණු**

- පාංශු සංරක්ෂණ පනත බලගැන්විම.
- පාංශු සංරක්ෂණ කටයුතු වගා ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කිරීම දිරි ගැන්වීම හා ආදර්ශන ලෙස පවත්වාගෙන යාම

| ව්‍යාපෘතිය | විස්තරය | කෘෂිකර්ම උපදේශක කොටස | ඇස්තමේන්තු මුදල රු. | සමුච්චිත වියදම රු. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| පාංශු සංරක්ෂණ වැඩසටහන | පාංශු සංරක්ෂණ කටයුතු හා ගොවීන් දැනුවත් කිරීම | මාරස්සන | 200,000.00 | 200,000.00 | 100% | ගොවීන් දැනුවත් කර අවසන්. පාංශු සංරක්ෂණ කටයුතු අවසන් කර ඇත |
| **එකතුව** | | | **200,000.00** | **200,000.00** | | |

### 2.2. 2021 වර්ෂයේ ලබා ගත් විශේෂ ජයග්‍රහණ

- **ජාතික ඵලදායිතා සම්මාන වැඩසටහන - විශේෂ කුසලතා සහතිකයක් ලබා ඇත.**

# මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සංවර්ධන දෙපාර්තමේන්තුව



## දැක්ම

ස්වයංපෝෂී දැයකට සියළු පශු නිපැයුම් මැදරටින්

## මෙහෙවර

සත්ව සෞඛ්‍ය, සත්ව අභිජනන ,ව්‍යාප්ති හා පුහුණු අංශයන්හි මූලය, භෞතික හා තාක්ෂණික සේවාවන් කාර්යක්ෂමවත් සාධාරණවත් අපක්ෂපාතිවත සැපයීම තුලින් පශු නිෂ්පාදනයන්ගෙන් ස්වයංපෝෂී භාවය ලගාකර ගැනිම සඳහා මධ්‍යම පළාත් සත්ව පාලනයේ යෙදෙන ගොවින් දිරි ගැන්වීම සහ ඔවුන්ගේ සමාජයීය හා ආර්ථිකමය සංවර්ධනය කරා මෙහෙයවීම.

### 3.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණුඃ-

1. පළාත් බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන සතුන්ගේ සෞඛ්‍ය තත්වය ආරක්ෂා කිරීම
2. ආර්ථිකමය වටිනාකමින් යුත් උසස් ජනන ශක්තියක් ඇති කෘෂිකාර්මික සත්ව රැලක් බෝකිරීම.
3. පශු සම්පත් අංශයේ තාක්ෂණික කාර්යක්ෂමතාව ඉහල නැංවීම හා එම අංශයේ පාර්ශවකරුවන්ට තාක්ෂණික දැනුම සම්ප්‍රේෂණයකර විම.
4. ඒකක නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම හා තිරසාර බව පවත්වා ගැනීම සඳහා උපාය මාර්ග යෙදීම
5. දේශීය කිරි, මස්, බිත්තර නිෂ්පාදන නංවාලීම සඳහා ඉහළම දායකත්වයක් ලබාදීම.
6. සත්ව පාලනය හා බැඳුණු රැකියා අවස්ථාවන් සුලභ කිරීම.

### 3.2 ව්‍යාපෘතීන්ට අදාල කාර්ය භාරය

සාමාන්‍ය පරිපාලනය 592-45-4-0

1. පශු සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රශස්ත සඵලදායිතාවයක් ලගා කර ගැනීමට දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය මෙහෙයවීම.
2. දෙපාර්තමේන්තුව සතු භෞතික සම්පත් සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම.
3. පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

පශු රෝහල 592-45-5-0

1. මහනුවර හා නුවරඑළිය ආශ්‍රිත කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන සතුන්ගේ සෞඛ්‍ය තත්වය ආරක්ෂා කිරීම.
2. සතුන්ගෙන් මිනිසාට වැළදෙන රෝග අවම කිරීම. (උදා: ජලභීතිකා රෝග මර්දනය)

සත්ව නිෂ්පාදන උන්නතිය 592-45-6-0

1. නිරෝගී සත්ව ගහණයක් පවත්වා ගැනීම සඳහා සත්ව රෝග පාලනය කිරීමේ හා වැලැක්වීමේ වැඩසටහන් සහ සත්ව ප්‍රතිකාර කටයුතු ක්‍රියාත්මක කිරීම
2. සතුන්ගේ නිෂ්පාදන ආර ලක්ෂණ උසස් කිරීම සඳහා සත්ව අභිජනන සේවා (ස්වභාවික හා කෘතිම සිංචන) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. සත්ව පාලනය පිළිබඳ ව්‍යාප්ති කටයුතු සිදු කිරීම
4. සතුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය තාක්ෂණික කටයුතු සිදු කිරීම.

### 3.3 ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීම

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා සැපයීම සඳහා මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල 03ක්, පශු වෛද්‍ය කාර්යාල 44ක් සහ පශු රෝහල් 02ක් ස්ථාපනය කර ඇත.

පශු සම්පත් සැලසුම්, පශු සම්පත් ව්‍යාපෘති, පශු සම්පත් ව්‍යාප්ති හා පුහුණු සේවා ඇතුළත් පශු සම්පත් සංවර්ධන කටයුතු සඳහාද, සත්ත්ව සෞඛ්‍ය, සත්ත්ව අභිජනන කටයුතු සඳහාද, දෙපාර්තමේන්තු මානව හා භෞතික සම්පත් කළමනාකරණය හා මූල්‍ය පාලන කටයුතු සඳහාද පළාත් අධ්‍යක්ෂ කාර්යාලය ක්‍රියාත්මක වේ.

ඒ අනුව පළාත් අධ්‍යක්ෂ කාර්යාලය සහ ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල 03ක් මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා ස්ථාපිත කර ඇත. මහනුවර දිස්ත්‍රික්කය සඳහා පශු වෛද්‍ය කාර්යාල 21ක්ද, මාතලේ දිස්ත්‍රික්කය සඳහා පශු වෛද්‍ය කාර්යාල 11ක්ද, නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා පශු වෛද්‍ය කාර්යාල 12ක්ද වශයෙන් ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 44ක් අයත් වේ. එසේම මහනුවර සහ නුවරඑළිය පශු රෝහල් 02ක්ද පිහිටුවා ඇත.

## 3.4 සංවිධාන සටහන




අ.ප.අ - අතිරේක පළාත්අධ්‍යක්ෂ
වි.වි. - විෂයානුබද්ධවිශේෂඥ
නි.අ - නියෝජ්‍යඅධ්‍යක්ෂ
ප්‍ර.ප.වෛ.නි. - ප්‍රධානපශු වෛද්‍යනිළධාරී
ප.වෛ.නි. - පශු වෛද්‍යනිළධාරී
ස.පා.නි - සත්වපාලනනිළධාරී
ස.ස.උ.-වි - සත්ව සංවර්ධන උපදේශක -විශේෂශ්‍රේණිය
ස.ස.උ. - සත්ව සංවර්ධන උපදේශක
ස.නි. - සංවර්ධන නිළධාරී
ප්‍ර.කළ.ස - ප්‍රධාන කළමණාකරණසහකාර
කළ.ස. - කළමණාකරණසහකාර
මු.ස. - මුදල්සහකාර
ම.භා. - මධ්‍යස්ථානභාරකරු
දි.ක. - දිස්පැන්සරිකම්කරු
දි.ලි. - දිස්පැන්සරි ලිපිකරු

### 3.5 2021 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ආයෝජනය හා ප්‍රගතිය




### 3.5.1 2021 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ආයෝජනය හා ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු.මි. | ප්‍රගතිය රු.මි. |
|---|---|---|---|
| **1. පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන සහ සඵලතාවය** | | | |
| 1,1 කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම | | | |
| 1.1.1 සත්ව අභිජනනය සහ කිරි ගොවිතැන ජනප්‍රිය කරවීම | | | |
| | සුළු පරිමාණ කිරි ගොවිපල පිහිටුවීම | 3.50 | 3.50 |
| | කෘතිම සිංචන වැඩසටහන | 3.00 | 3.00 |
| | දෙනගේ අභිජනන කාර්යක්ෂමතාව වර්ධනය කිරීම | 7.79 | 7.78 |
| | දෙනගේ වඳභාවයට ප්‍රතිකාර කිරීම | 0.50 | 0.50 |
| 1.1.2 තණබිම් සංවර්ධනය සහ සංරක්ෂණය | | | |
| | තෘණ වගා ව්‍යාපෘතිය | 0.66 | 0.66 |
| | ගොවිපල යාන්ත්‍රීකරණය (Introduction of Silage ) (TMR Production) | 3.75 | 3.75 |
| 1.1.3 සත්ව සෞඛ්‍යය | | | |
| 7 | ජංගම පශු වෛද්‍ය සේවා ප්‍රවර්ධනය | 5.75 | 5.75 |
| 8 | ගවගාල් වැඩිදියුණු කිරීම | 6.60 | 6.60 |
| 1.2 මස් නිෂ්පාදනය ඉහල නැංවීම | | | |
| | එළු අභිජනන ඒකක පිහිටුවීම | 2.64 | 2.64 |
| | සූකර ගොවිපල සංවර්ධනය කිරීම. | 0.30 | 0.30 |
| | ගෘහාශ්‍රිත කුකුළු පාලනය | 2.09 | 2.09 |
| | **එකතුව** | **36.58** | **36.57** |





සුළු පරිමාණ කිරි ගොවිපල සංර්ධනය
පශු වෛද්‍ය කොට්ඨාසය - හැටන්



තෘණ වගා ව්‍යාපෘතිය
පශු වෛද්‍ය කොට්ඨාසය - මස්කෙළිය



ගවගාල් වැඩිදියුණු කිරීම පශු වෛද්‍ය කොට්ඨාසය - හැටන්









| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු.මි. | ප්‍රගතිය රු.මි. |
|---|---|---|---|
| **2. ධාරිතා සංවර්ධනය** | | | |
| i | නායකත්ව ගොවි පුහුණු | 0.44 | 0.44 |
| ii | තරුණ ගොවි පුහුණු | 0.48 | 0.48 |
| iii | අත්‍යාවශ්‍ය සේවා සඳහා නව තාක්ෂණික උපකරණ හඳුන්වාදීම. | 5.50 | 5.40 |
| iv | අත්‍යාවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීම. | 2.00 | 2.00 |
| v | පශු වෛද්‍ය කාර්යාල පරිශ්‍ර සංවර්ධනය කිරීම. | 4.00 | 4.00 |
| vi | කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා කර සංවර්ධනය කිරීම. | 20.00 | 4.00 |
| vii | නිලධාරි පුහුණු | 0.95 | 0.95 |
| viii | ගොවිසවිය සඟරාමය වැඩසටහන | 0.05 | 0.05 |
| | **එකතුව** | **33.42** | **17.32** |




ගොවි පුහුණු - පශු වෛද්‍ය කොට්ඨාසය - පුස්සැල්ලාව

3.6 රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන්

ප්‍රතිපාදන මූලාශ්‍රය : පශු සම්පත්, ගොවිපල ප්‍රවර්ධන හා කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත අමාත්‍යාංශය

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු.මි. | ප්‍රගතිය රු.මි. |
|---|---|---|---|
| 1 | අභිජනන ගොවිපල් ව්‍යාපෘතිය | 5.00 | 5.00 |
| 2 | පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඇති අභිජනන ගොවිපල් වැඩිදියුණු කිරීම | 5.00 | 5.00 |
| 3 | පරිසර හිතකාමි සූකර ගොවිපල් ව්‍යාපෘතිය | 1.60 | 1.60 |
| 4 | කුකුල් ගොවිපල් ස්ථාපිත කිරීම - සතුන් 10 | 0.45 | 0.45 |
| 5 | කුකුල් ගොවිපල් ස්ථාපිත කිරීම - සතුන් 50 | 1.88 | 1.88 |
| 6 | කුකුල් ගොවිපල් ස්ථාපිත කිරීම - සතුන් 100 | 1.50 | 1.50 |
| 7 | කුකුල් මස් සැකසුම් මධ්‍යස්ථාන හා ශීතාගාර පහසුකම් සපයා දීමේ ව්‍යාපෘතිය | 0.44 | 0.44 |
| 8 | කිරි සැකසුම් මධ්‍යස්ථාන ඇති කිරීම හා කිරි සැකසුම් මධ්‍යස්ථාන නවීකරණ කටයුතු කිරීම | 6.11 | 6.11 |
| 9 | කිරි අලෙවිසැල් ස්ථාපනය කිරීම | 3.00 | 2.70 |
| 10 | දියර කිරි නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් ලබා දීම තුලින් කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන | 1.10 | 1.09 |
| 11 | පිරිසිදු එළකිරි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා ගැනීම | 2.55 | 2.55 |
| 12 | තෘණ හා පෝෂ්‍ය තෘණ වගා කිරීම හා සංරක්ෂණය | 8.76 | 8.76 |
| 13 | දෙනගේ අභිජනන කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම (Optimizing Transient cow performance) | 18.90 | 18.90 |
| 14 | සයිලේජ් නිෂ්පාදන දිරිගැන්වීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීම | 0.91 | 0.91 |
| 15 | අභිජනන හැකියාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සත්ව ආහාර, ඛනිජ ලවණ සහ හෝමෝන ලබා දීම | 0.80 | 0.80 |
| 16 | පළාත් සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා සත්ව අභිජනනය සඳහා වූ උපකරණ ලබා දීම | 4.20 | 4.20 |
| | | **62.19** | **61.88** |
| 17 | පරිපාලන වියදම් - කුකුල් පැටවු<br>පරිපාලන වියදම් - දියර කිරි<br>පරිපාලන වියදම්- සත්ව පෝෂණය | 1.04 | 0.11 |
| | **එකතුව** | **63.23** | **61.99** |





ගෘහාශ්‍රිත කුකුළු පාලනය
පශු වෛද්‍ය කොට්ඨාසය - දික්ඔය

3.7 රේබීය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් - 2021

ප්‍රතිපාදන මූලාශ්‍රය : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්මේන්තුව

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු.මි. | ප්‍රගතිය රු.මි. |
|---|---|---|---|
| 1 | කණ් සලකුණු කිරීමේ වැඩසටහන | 0.02 | 0.02 |
| 2 | වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ වැඩසටහන | 2.10 | 2.10 |
| 3 | කුර හා මුඛ රෝග මර්දන වැඩසටහන | 1.00 | 1.00 |
| **එකතුව** | | **3.12** | **3.12** |

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු.මි. | ප්‍රගතිය රු.මි. |
|---|---|---|---|
| 1 | ගොවිපල සත්ත්ව අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය | 4.00 | 4.00 |
| **එකතුව** | | **4.00** | **4.00** |

# මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව



## දැක්ම

තිරසාර වූ වාරි ජල සැපයුමක් මගින් වැඩි භූමි ප්‍රමාණයක් අස්වැද්දීම.

## මෙහෙවර

වාරිමාර්ග පද්ධති නඩත්තුව, ගොවි බිම්වලට නිකුත් කළ වාරි ජල කළමනාකරණය හා

ආර්ථික ලාභදායී මෙන්ම නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින්

## 4.1 අරමුණු හා කාර්යයන්

### අරමුණු

- ජල පද්ධති හා වාරිමාර්ග නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.
- වාරි මාර්ග පද්ධති ඉදිකිරීම හා නවීකරණය තුලින් වැඩි භූමි ප්‍රමාණයක් වගා කිරීමට සැලැස්වීම.
- ගංවතුර මගින් කෘෂි ඉඩම්වලට හා වාරි පද්ධති වලට වන හානි පාලනය කිරීම.
- කුඹුරු ඉඩම් සඳහා වාරි පහසුකම් සහ ජල අපවහන පහසුකම් සලසා දීම.
- සුළු වාරිමාර්ගවල කාර්යක්ෂමතාව වැඩිකර ගැනීම සහ මනා ජල කළමනාකරණයක් ඇති කිරීම.

### කාර්යයන්

- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට ගැනෙන වාරිමාර්ග හඳුනාගෙන ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීම
- පළාතේ වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නඩත්තු කිරීම.
- සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම
- වාරි කර්මාන්ත තුළ හෝ ඊට ප්‍රවේශ ලබන්නා වූ මාර්ග පද්ධති සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම.
- වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු මෙන්ම වාරි කළමනාකරණ ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම.
- වාරි පද්ධතිවලට හා එහි නිර්මිතවලට හානි පමුණුවන, අල්ලාගනු ලබන සහ වාරි කර්මාන්තයක රැස්කොට තබා ඇති ජලය කවර හෝ ආකාරයකට ඕනෑකමෙන් හෝ ද්වේශ සහගත ලෙස හෝ අපෙත්යාමට සලසනු ලබන පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම.
- යම් වාරි කර්මාන්තයකදී යම් වාණිජ ක්‍රියාකාරකමක නියැලීම හෝ කර්මාන්තයක නියැලීම හෝ එවැනි වාරි කර්මාන්තයක් අනවසර ක්‍රියාකාරකම් සඳහා උපයෝගි කරගන්නා පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම.
- වාරි රක්ෂිත ප්‍රදේශ හඳුනා ගැනීම, සීමා නිර්ණය කිරීම, සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සහ වාරිමාර්ග පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.
- වාරි පද්ධතිවලට හා කෘෂි ඉඩම්වලට සිදුවන ගංවතුර හා නාය යෑම් වැනි පාරිසරික හානි පාලනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම හා ක්‍රම සම්පාදනය කිරීම.
- වාරි කර්මාන්ත වලින් සැපයෙන ජලය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා ජලය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම.
- වාරි කර්මාන්ත ඉදිකිරීම, නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම හා ජල කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම මඟින් ධාරිතා සංවර්ධනය කිරීම.
- වාරි කර්මාන්තවලට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරන අවස්ථාවලදී ඇතිවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අදාළ ආයතන හා බලධාරීන් සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යෑම.
- වගා කළ යම් ප්‍රදේශයක ජලය බැස යාමට සැලැස්වීම හෝ ඒ ප්‍රදේශයට ජලය ගලා ඒම හෝ ඉන් පිටතට ගලා යාම වැළැක්වීම විධිමත් කිරීම හෝ එවැනි ප්‍රදේශ ජලගැලීම් වලින් ආරක්ෂා කිරීම සඳහා ඉදි කරන ලද යම් ඉංජිනේරු කර්මාන්තයක් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදි කිරීම, නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම.
- වාරි කර්මාන්ත නඩත්තු කිරීම සහ ඉදිකිරීම් වලදී වෙනත් යම් රජයේ හෝ රාජ්‍ය නොවන හෝ ස්වේච්ඡා සංවිධානවල සහභාගිත්වය ලබාගැනීම.

- අමාත්‍යාංශ ලේකම්ගේ අධීක්ෂණය යටතට ගැනෙන විෂයන් වලට අදාල ඉංජිනේරුමය උපදේශනය

## 4.2. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිළිබඳ හැඳින්වීම.

මධ්‍යම පළාත් සභාවේ 2017 අංක 05 දරණ වාරිමාර්ග ප්‍රඥප්තිය 2018.10.03 දින මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද අතර අංක 2091/51 හා 2018.10.04 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලදි. එමගින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් බලාත්මක කරන ලදි.

මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2005.04.06 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මත මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවක් ලෙස 2006.01.01 වන දින ස්ථාපිත කර ඇත. දෙපාර්තමේන්තුව පළාත් අධ්‍යක්ෂවරයකු යටතේ පාලනය වන අතර මුලස්ථාන වාරිමාර්ග ඉංජිනේරු ඇතුළු ඉංජිනේරුවරුන් හතර දෙනෙකුගෙන් යුක්ත වේ. මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් කාර්යාල 03 ක් ස්ථාපනය කර ඇති අතර දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය 53 කි.

මෙම දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරුන් ලෙස පහත නිලධාරීන් කටයුතු කර ඇත.

| | |
|---|---|
| 2006 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා | - ඉංජි. ඒ.ජේ.එම්.එම්.නිස්තාර් මහතා |
| 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා | - ඉංජි. පී.එම්.එස්.අයි.රත්නායක මහත්මිය |
| 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා | - ඉංජි. එම්.එස්.බී.මිල්ලන්ගොඩ මහතා |
| 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා | - ඉංජි. එස්.කේ.අයි.විජේවර්ධන මහත්මිය |
| 2020. 02, 07 සිට මේ දක්වා | - ඉංජි. එස්.ඒ.එස්.කේ. විජේසේකර මහත්මිය |

දෙපාර්තමේන්තුවේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා මානව හා භෞතික සම්පත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කර ගනිමින් දෙපාර්තමේන්තුවේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

4.3 දෙපාර්තමේන්තු සංවිධාන සටහන



## 4.4 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති (සාරාංශය)

2021 වර්ෂයේ වාරි පද්ධති පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම සඳහා මුල් කාර්තුව සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 125,000 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත.

එම ප්‍රතිපාදන මගින් වාරි පද්ධති සංවර්ධනය සඳහා රුපියල් මිලියන 88,462 ක් වෙන්කර ව්‍යාපෘති 63ක් ද ධාරිතා සංවර්ධනය සඳහා රුපියල් මිලියන 36,537 ක්ද වෙන්කර ව්‍යාපෘති 05 ක්ද උපමාන පාදක ප්‍රදාන යටතේ රුපියල් මිලියන 2,500 ක්ද වෙන්කර ව්‍යාපෘති 02 ක් 100% ක භෞතික ප්‍රගතියක් අත්කර ගනිමින් නිම කරන ලද අතර සිවිල් ඉංජිනේරු උපදේශන සේවය යටතේ රුපියල් මිලියන 67,582 ක් වටිනා ව්‍යාපෘති 64 ක් නිම කර ඇත. සාරාංශය පහත පරිදි වේ

| දෙපාර්තමේන්තුව/ අංශය | ප්‍රතිපාදන ප්‍රභවය | වැඩසටහන | ඇස්තමේන්තු කරන ලද ව්‍යාපෘති ගණන | | 2021 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදන අනුව ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | | |
|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු මුදල රු.මිලියන | ව්‍යාපෘති ගණන | ප්‍රගතිය% | |
| | | | | | | භෞතික | මූල්‍ය |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | | | | | | | |
| මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | වාරිමාර්ග පද්ධති සංවර්ධනය | 63 | 88,462 | 63 | 100 | 99,57% |
| | | ධාරිතා සංවර්ධනය | 5 | 36,537 | 5 | 100 | 88,26% (අතැති බිල්පත් රු,මි,14,290) |
| උප එකතුව | | | 68 | 125,000 | 68 | 100 | 88,26 |
| මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | උපමාන පාදක | වාරිමාර්ග පද්ධති සංවර්ධනය | 2 | 2,500 | 2 | 100 | 100 |
| මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාරි සෞභාගයා වැඩසටහන | | 17 | 43,955 | 17 | 80 | අතැති බිල්පත් රු,මි,3,0 අවිච්ඡේද ව්‍යාපෘති- 05 |
| **මුළු එකතුව** | | | **87** | **171,455** | **87** | **95** | |

| තාක්ෂණ සහය ලබාදුන් ව්‍යාපෘති (උපදේශන සේවා) | | | | | |
|---|---|---|---|---|---|
| | ව්‍යාපෘතිය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු වටිනාකම රු.මි | ව්‍යාපෘති ගණන | ප්‍රගතිය% භෞතික |
| මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | කෘෂි මාර්ග සංවර්ධන වැඩසටහන | 09 | 11,391 | 09 | 100 |
| | චතුයටිතල පහසුකම් සංවර්ධනය | 26 | 40.525 | 26 | 100 |
| | මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් | 06 | 2,711 | 06 | 100 |
| | උප එකතුව | 38 | 63,215 | 37 | |
| මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | 29 | 32,502 | 29 | 100 |
| ලෝක බැංකු ආධාර යටතේ ගබඩා පහසුකම් ලබා දීමේ වැඩසටහන | | 07 | 82,989 | - | සංශෝධිත ප්‍රමාණ පත්‍ර යොමුකර ඇත, |
| කෘෂිකර්ම නවීකරන ව්‍යාපෘතිය | | 01 | 10,894 | - | ඇස්තමේන්තු යොමුකර ඇත, 2021 ක්‍රියාත්මක නොවීය |
| කසළ කළමනාකරණ වැඩසටහන | | 02 | 3,640 | 02 | 100 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | 02 | 0,405 | 02 | ඇස්තමේන්තු යොමුකර ඇත, |
| **මුළු එකතුව** | | | **183,586** | 82 | |

### 4,5. 2021 වර්ෂයේ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

### 4.5.1 - වාරිමාර්ග පද්ධති සංවර්ධනය

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවගේ වගා කටයුතු සංවර්ධන සඳහා රු.මිලියන 21,010 ක් වැය කර ව්‍යාපෘති 20 ක 100% ක භෞතික ප්‍රගතියක් අත්කර ගනිමින් ඉටුකර ඇත. එම ව්‍යාපෘති පහතින් දක්වා ඇත.

**මහනුවර දිස්ත්‍රික්කය**

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කෙරෙන ප්‍රදේශය | වෙන්කළ මුදල රු. | ප්‍රගතිය | | | ප්‍රතිලාභීන් සංඛයාව | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය | | භෞතික ප්‍රගතිය(%) | ගොවි පවුල් | කුඹුරු අක්කර |
| | | | | රු,මි, | (%) | | | |
| 1 | ගලපල්ල අමුණේ ඇළ වැඩිදියුණු කිරීම | මිණිපේ | 0,584 | 0,584 | 100 | 100 | 11 | 12 |
| 2 | ඇතාමුල්ල වැව පුනරුත්ථාපනය කිරීම, | තුම්පනේ | 0769 | 0769 | 100 | 100 | 14 | 10 |
| 3 | කිවුලේ වැව වැඩිදියුණු කිරීම | මිණිපේ | 1,250 | 1,250 | 100 | 100 | 23 | 37 |
| 4 | තලකොටුවේ වැව පුනරුත්ථාපනය කිරීම, | මිණිපේ | 0,844 | 0,844 | 100 | 100 | 9 | 13 |
| 5 | රසකිඳ උල්පත ඇළ වැඩිදියුණු කිරීම | මිණිපේ | 0753 | 0,753 | 100 | 100 | 40 | 90 |
| 6 | ගැටලාගොල්ල ඇළ පුනරුත්ථාපනය කිරීම, | මිණිපේ | 1,424 | 1,424 | 100 | 100 | 66 | 94 |
| 7 | කැන්දගොල්ල අමුණ වැඩිදියුණු කිරීම | උඩදුම්බර | 1,987 | 1,987 | 100 | 100 | 18 | 12 |
| 8 | පල්ල ලියම්බින්න ඇළ හා අමුණ (ග්‍රා,නි, වසම - මීමුරේ) | උඩදුම්බර | 1,065 | 1,065 | 100 | 100 | 11 | 12 |
| 9 | වැලිලියද්ද අමුණ වැඩිදියුණු කිරීම | මිණිපේ | 0,470 | 0,470 | 100 | 100 | 18 | 34 |
| 10 | බණගම්වෙල අමුණ වැව පුනරුත්ථාපනය කිරීම, | පූජාපිටිය | 1,678 | 1,674 | 100 | 100 | 34 | 20 |
| 11 | උණමුවයාය අමුණ පුනරුත්ථාපනය කිරීම, | පූජාපිටිය | 1,339 | 1,339 | 100 | 100 | 15 | 12 |
| 12 | මඩකුඹුර අමුණ වැඩිදියුණු කිරීම | පාතහේවාහැට | 0,838 | 0,838 | 100 | 100 | 40 | 35 |
| 13 | හිල්ඔය වහල ඇළ වැඩිදියුණු කිරීම | මැදදුම්බර | 1,196 | 1,196 | 100 | 100 | 110 | 125 |
| 14 | කපුලියද්ද වලලියද්ද ඇළ වැඩිදියුණු කිරීම , | පාතහේවාහැට | 0,837 | 0,641 | 77 | 100 | 16 | 12 |
| 15 | කොල්ළෑකුඹුර ඇළ වැඩිදියුණු කිරීම | පාතහේවාහැට | 2,000 | 2,000 | 100 | 100 | 65 | 54 |
| 16 | ඇතුල්ගම කරඳවල ඇළ මාර්,ය සංවර්ධනය කිරීම | පාතහේවාහැට | 0,967 | 0,967 | 100 | 100 | 40 | 38 |
| 17 | දොඩම්ගොල්ල අමුණ වැඩිදියුණු කිරීම | කුණ්ඩසාලේ | 0,447 | 0,447 | 100 | 100 | 40 | 25 |
| 18 | කොස්තොටයාය අමුණ වැඩිදියුණු කිරීම , | හතරලියද්ද | 0,821 | 0,821 | 100 | 100 | 25 | 15 |
| 19 | වීරක්කොඩියාය ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | තුම්පනේ | 1,000 | 1,000 | 100 | 100 | 40 | 38 |
| 20 | අමුණුපුර නාගහමුල අමුණ | යටිනුවර | 0,950 | 0,941 | 99 | 100 | 35 | 20 |
| | එකතුව | | **21,219** | **21,010** | **99** | **100** | **670** | **708** |

ඉහත සඳහන් ආකාරයට මහනුවර දිස්ත්‍රික්කයේ වැඩිදියුණු කළ ඇළ මාර්ග හා අමුණු සංවර්ධනය මගින් අක්කර **708** ක් අස්වැද්දීම සඳහා ගොවි පවුල් **670** ක් සඳහා සෙත සැලසීමට හැකි විය. එය පහත ප්‍රස්තාරය මගින් ද පිළිබිඹු වේ




**මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ඇතුළත් ඡායාරූප කිහිපයක්**

*කපුලියද්ද වලලියද්ද ඇළ*



*කොල්ලෑකුඹුර ඇළ*



*දොඩම්ගොල්ල අමුණ ප්‍රතිසංස්කරණය කිරීම*



*ඇතාමුල්ල වැව*



## මාතලේ දිස්ත්‍රික්කය

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 29 ක් 100% ප්‍රගතියක් අත්පත් කරගනිමින් ඉටුකරන ලද ව්‍යාපෘති පහතින් දක්වා ඇත.

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කෙරෙන ප්‍රදේශය | වෙන්කළ මුදල රු. | ප්‍රගතිය | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය | | භෞතික ප්‍රගතිය | ගොවි පවුල් | කුඹුරු අක්කර |
| | | | | රු. | (%) | | | |
| 01 | ගෝනමඩ මූකලන් යාය වැව වැඩිදියුණු කිරීම | නාවුල | 1,999 | 1,999 | 100 | 100 | 45 | 45 |
| 02 | දොඩම්ගස් ඇළ අමුණ හා ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | උකුවෙල | 1,810 | 1,810 | 100 | 100 | 54 | 36 |
| 03 | උඩතැන්න වැව | නාවුල | 1,999 | 1,999 | 100 | 100 | 120 | 120 |
| 04 | දෙහිගහකොටුව එනමල්පොත ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | නාවුල | 1,965 | 1,965 | 100 | 100 | 30 | 21 |
| 05 | පොල්වත්තාකදුර ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | දඹුල්ල | 1,163 | 1,163 | 100 | 100 | 61 | 88 |
| 06 | කොස්ගහමුල තැන්න ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | රත්තොට | 1,948 | 1,948 | 100 | 100 | 25 | 30 |
| 07 | ඇටවරාහේන ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | දඹුල්ල | 0,749 | 0,749 | 100 | 100 | 110 | 72 |
| 08 | උඩවෙලයාගම වැව වැඩිදියුණු කිරීම | දඹුල්ල | 1,620 | 1,620 | 100 | 100 | 28 | 25 |
| 09 | මොරගොල්ල ඉහළවෙල අමුණ වැඩිදියුණු කිරීම | නාවුල | 1,454 | 1,454 | 100 | 100 | 35 | 35 |
| 10 | පොල්අත්තාව සිට පිදුරන්ගල ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම අදියර 1 | දඹුල්ල | 1,499 | 1,499 | 100 | 100 | 200 | 180 |
| 11 | පොල්අත්තාව සිට පිදුරන්ගල ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම අදියර 2 | දඹුල්ල | 1,726 | 1,726 | 100 | 100 | 200 | 180 |
| 12 | බඹරගස්වැව පහළවැව වැඩිදියුණු කිරීම | ගලේවෙල | 1,450 | 1,450 | 100 | 100 | 125 | 140 |
| 13 | රත්මල්ගහඹය ඇළ වැඩිදියුණු කිරීම | ගලේවෙල | 1,348 | 1,348 | 100 | 100 | 34 | 36 |
| 14 | සපුගස්තැන්න අමුණ හා ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | මාතලේ | 1,992 | 1,992 | 100 | 100 | 68 | 27 |
| 15 | මීගහකුඹුරඅමුණ හා ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | ගලේවෙල | 1,112 | 1,112 | 100 | 100 | 60 | 50 |
| 16 | කැන්දගොල්ල ඇත්ගාල අමුණ හා ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | නාවුල | 1,995 | 1,995 | 100 | 100 | 24 | 22 |
| 17 | බණ්ඩාර ඇළ අමුණේ ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | උකුවෙල | 1,349 | 1,349 | 100 | 100 | 50 | 31 |
| 18 | තලයාය ඇළ වැඩිදියුණු කිරීම | නාවුල | 1,741 | 1,741 | 100 | 100 | 90 | 45 |
| 19 | ඇල්ල අමුණ ඇළ වැඩිදියුණු කිරීම | ගලේවෙල | 1,687 | 1,687 | 100 | 100 | 80 | 64 |
| 20 | උඩහ අංග අමුණ වැඩිදියුණු කිරීම | රත්තොට | 1,492 | 1,492 | 100 | 100 | 35 | 35 |
| 21 | කිරිවන්දල ඇළ වැඩිදියුණු කිරීම | ගලේවෙල | 0,801 | 0,801 | 100 | 100 | 196 | 145 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 22 | හල්මිල්ලපිටියට ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | උකුවෙල | 1,576 | 1,576 | 100 | 100 | 12 | 15 |
| 23 | ඇහැළගහ යට වැවේ රොන් මඩ ඉවත් කිරීම | දඹුල්ල | 1,938 | 1,938 | 100 | 100 | 27 | 30 |
| 24 | මැටිහක්ක දෙහිපිටවල අමුණ වැඩිදියුණු කිරීම, ii අදියර | අඹන්ගඟකෝර ළේ | 1,414 | 1,414 | 100 | 100 | 105 | 65 |
| 25 | මැටිහක්ක දෙහිපිටවල අමුණ වැඩිදියුණු කිරීම, i අදියර | අඹන්ගඟකෝර ළේ | 1,746 | 1,746 | 100 | 100 | 105 | 65 |
| 26 | හුරුවී කොටුව ඇළ වැඩිදියුණු කිරීම | දඹුල්ල | 1,992 | 1,992 | 100 | 100 | 40 | 25 |
| 27 | වත්තේගම්මැද්ද ඇළ වැඩිදියුණු කිරීම | දඹුල්ල | 1,188 | 1,188 | 100 | 100 | 70 | 20 |
| 28 | බඹරගස්වැව කුඩා වැව ගැඹුරු කිරීම | ගලේවෙල | 1,998 | 1,998 | 100 | 100 | 40 | 40 |
| 29 | උඩතැන්න වැවේ ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | නාවුල | 3,000 | 3,000 | 100 | 100 | 120 | 120 |
| | උප එකතුව | | **47,751** | **47,751** | **100** | **100** | **1884** | **1562** |

මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ ඉහත සදහන් වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති සදහා රු.මි. 47,751 ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගැනීමට හැකි වූ අතර ඒ යටතේ ගොවි පවුල් **1884** කගේ පමණ ජීවන වෘත්තිය වන කෘෂි කර්මාන්තය සඳහා පිටුවහල් වේ. ගොවි පවුල් සංඛ්‍යාව හා අස්වැද්දීමට හැකි වූ නව කුඹුරු ඉඩම් ප්‍රමාණයන් පහත සඳහන් ප්‍රස්තාරය මගින් වැඩිදුරටත් පැහැදිලි කර ගැනීමට හැක.

**මාතලේ දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභී ගොවි පවුල් සහ අස්වද්දන ලද කුඹුරු අක්කර ප්‍රමාණයන්**



**මාතලේ දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතීන් දැක්වෙන ඡායාරූප කිහිපයක්**

*ඇටවරා හේන ඇළ මාර්ගය*



*මීගහකුඹුර අමුණ හා ඇළ මාර්ගය*



**උඩතැන්න වැව**



**සපුගස්තැන්න අමුණ හා ඇළ මාර්ගය**



## නුවරඑළිය දිස්ත්‍රික්කය

නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා රු. මි. 19,321 මුදලක් වැයකර වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති 14 ක් ඉටුකරන ලදී. ඒ යටතේ ප්‍රදේශයේ නව කුඹුරු අක්කර **584** ක් පමණ අස්වැද්දීමට හැකියාව ලැබෙන අතර මෙමගින් ගොවි පවුල් **845** කගේ පමණ ජීවන තත්වය නගා සිටුවීමට හැකියාව ලැබේ. එසේ ඉටුකරන ලද ව්‍යාපෘති පහත දක්වා ඇත.

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කෙරෙන ප්‍රදේශය | වෙන්කළ මුදල රු.මි | ප්‍රගතිය | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය | | භෞතික ප්‍රගතිය | ගොවි පවුල් | කුඹුරු අක්කර |
| | | | | රු. | (%) | (%) | | |
| 01 | කන්දෙකුඹුර ඉහළ ඇළ වැඩිදියුණු කිරීම | වලපනේ | 0.893 | 0,893 | 100 | 100 | 60 | 35 |
| 02 | ගුරුගල්ඔළුව අමුණ සහ ඇළ ප්‍රතිසංස්කරණය කිරීම | කොත්මලේ | 1.572 | 1,572 | 100 | 100 | 80 | 60 |
| 03 | නාරංතොට ඇළ වැඩිදියුණු කිරීම | කොත්මලේ | 1.543 | 1,543 | 100 | 100 | 45 | 30 |
| 04 | ඔය අරාව ඇළ වැඩිදියුණු කිරීම නැගිටිඅරාව කොටස | වලපනේ | 1.696 | 1,696 | 100 | 100 | 65 | 42 |
| 05 | වැලිකඩ ඇල්ල ඇළ - ඔතුම් කැටිය කොටස වැඩිදියුණු කිරීම | කොත්මලේ | 1.750 | 1,647 | 94% | 100 | 200 | 150 |
| 06 | අඹලන්දේ කුඹුර ඇළ වැඩිදියුණු කිරීම | වලපනේ | 0.821 | 0,821 | 100 | 100 | 14 | 15 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 07 | රම්මල්කඳුර අමුණ ප්‍රතිසංස්කරණය කිරීම | හඟුරන්කෙත | 1.383 | 1,383 | 100 | 100 | 30 | 30 |
| 08 | පහළ දොරකුඹුර ඇළ ඉදිකිරීම | කොත්මලේ | 1.773 | 1,773 | 100 | 100 | 70 | 40 |
| 09 | කුරුපනාවෙල මාඋස්සාගල ඇළ වැඩිදියුණු කිරීම අදියර 01 | වලපනේ | 1.899 | 1,899 | 100 | 100 | 135 | 75 |
| 10 | කුරුපනාවෙල මාඋස්සාගල ඇළ වැඩිදියුණු කිරීම අදියර 02 | වලපනේ | 1.732 | 1,732 | 100 | 100 | 135 | 75 |
| 11 | පල්ලේගෙදර වත්ත ඇළ වැඩිදියුණු කිරීම | හඟුරන්කෙත | 4.000 | 4,000 | 100 | 100 | 33 | 18 |
| 12 | පිහිලිමුල්ල ඇළ වැඩිදියුණු කිරීම | හඟුරන්කෙත | 0.239 | 0,239 | 100 | 100 | 11 | 9 |
| 13 | වැලිකඩ ඇළ වැඩිදියුණු කිරීම | කොත්මලේ | 1.975 | 1,907 | 97% | 100 | 80 | 60 |
| 14 | අමනාගල අමුණ සහ ඇළ වැඩිදියුණු කිරීම | හඟුරන්කෙත | 1.816 | 1,816 | 100 | 100 | 22 | 20 |
| | **එකතුව** | | **19.492** | **19,321** | **99%** | **100** | **845** | **584** |

ඉහතින් දක්වන ලද සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රතිලාභී ගොවි පවුල් සහ අස්වද්දන ලද කුඹුරු අක්කර ප්‍රමාණයන් පහත ප්‍රස්ථාරයෙන් පිළිබිඹු වේ.



## නුවරඑළිය දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතීන් දැක්වෙන ඡායාරූප

කුරුපනාවෙල මාවුස්සාගල වැව



අඹලන්දේ කුඹුර ඇළ මාර්ගය



නාරංතොට ඇළ මාර්ගය



ගුරුගල්ඹය අමුණ සහ ඇළ



### 4.5.2 ධාරිතා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2021 වසරේ ලැබී ඇති ප්‍රතිපාදන මගින් ධාරිතා සංවර්ධනය යටතේ රු.මිලියන 36,537 කින් පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකරන ලදී . මෙම ව්‍යාපෘති භෞතික ප්‍රගතිය 100 % ක් ලබා ගෙන ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම් | වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | | අතැති බිල්පත් | 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | | | රු.මි. | % | | |
| 01 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල - 2 වන අදියර | 30.152 | 20,030 | 66% | 10,121 | 100 |
| 02 | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | 2.000 | 1,996 | 100% | - | 100 |
| 03 | ධාරිතා සංවර්ධනය | 0.050 | 0.050 | 100% | - | 100 |
| 04 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රැඳවුම් බැම්ම හා ආශ්‍රිත ඉදිකිරීම් | 1.000 | 0.066 | 7% | 0,934 | 100 |
| 05 | පිළිමතලාවේ දි.වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල පාද බැම්ම ඉදිකිරීම හා ගරාජය වැඩිදියුණු කිරීම, | 3.335 | 0.100 | 3% | 3,235 | 100 |
| **එකතුව** | | **36,537** | **22,242** | **60,88%** | **14.290** | **100** |

## 4.6. වාරි සෞභාග්‍යා වැඩසටහන

| ක්‍රියාකාරකම | ඇස්තමේන්තු මුදල රු. | 2021 ට ගෙවන ලද මුළු බිල්පත් වටිනාකම | 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය | සටහන |
|---|---|---|---|---|
| **මහනුවර දිස්ත්‍රික්කය** | | | | |
| කිත්සරදෙණිය වැව | 1.300 | - | 03% | ව්‍යාපෘතිය 2022 වර්ෂය සඳහා අවිච්ඡේද විය. |
| මොරගොල්ල වැව | 0.650 | - | 03% | ව්‍යාපෘතිය 2022 වර්ෂය සඳහා අවිච්ඡේද විය. |
| වැලිකුඹුර වැව | 0.975. | 0.803 | 100% | ඉදි කිරීම් අවසන් |
| උඩඅරඹ අමුණ | 0.345 | 0.141 | 100% | ඉදි කිරීම් අවසන් |
| ඉබ්බන්වල අමුණ | 2.700 | 2.291 | 100% | ඉදි කිරීම් අවසන් |
| හපුවත්ත අමුණේ සිට පල්ලේතැන්නයාය වාරි ඇළ සංවර්ධනය කිරීම | 1.800 | 0.914 | 100% | ඉදි කිරීම් අවසන් |
| පල්ලේවත්ත අමුණේ සිට දික්ලියද්ද යාය දක්වා වාරි ඇළ සංවර්ධනය කිරීම | 1.700 | 0.282 | 45% | * ව්‍යාපෘතිය 2022 වර්ෂය සඳහා අවිච්ඡේද විය. |
| **මාතලේ දිස්ත්‍රික්කය** | | | | |
| රාජසන්තකයාය වැවේ වාන් ඇළ වැඩි දියුණු කිරීම | 4.925 | 4.374 | 100% | ඉදි කිරීම් අවසන් |
| සියඹලාව ගලලියද්ද ඇළ පද්දතිය පුනරුත්තාපනය කිරීම | 1.802 | 1.756 | 100% | ඉදි කිරීම් අවසන් |
| සියඹලාව වැව ප්‍රතිසංස්කරණය කිරීම | 4.703 | 4.173 | 100% | ඉදි කිරීම් අවසන් |
| හඹරගහ ඇළ වැව | 3.112 | 2.456 | 100% | ඉදි කිරීම් අවසන් |
| පොතාන ඇළ පද්ධතිය පුනරුත්තාපනය කිරීම | 4.185 | 4.178 | 100% | ඉදි කිරීම් අවසන් |
| පොතාන මහ වැව පුනරුත්තාපනය කිරීම | 4.998 | 4.998 | 100% | ඉදි කිරීම් අවසන් |
| **නුවරඑළිය දිස්ත්‍රික්කය** | | | | |
| නාරංකඳුර වැව | 2.080 | 1.860 | 100% | ඉදි කිරීම් අවසන් |
| නිකතැන්න වැව | 4.354 | 2.586 | 100% | ඉදි කිරීම් අවසන් |
| විජයබාහු කන්ද වැව | 2.592 | 0.521 | 51% | * ව්‍යාපෘතිය 2022 වර්ෂය සඳහා අවිච්ඡේද විය. |
| බංගලාව කුඹුර වැව වැඩි දියුණු කිරීම | 2.350 | 0.653 | 55% | * ව්‍යාපෘතිය 2022 වර්ෂය සඳහා අවිච්ඡේද විය. |
| **මුළු එකතුව** | **43.955** | **31.994** | | |



සියඹලාව ගලලියද්ද ඇල පද්ධතිය ප්‍රතිසංස්කරණය



හබරගහ ඇල ප්‍රතිසංස්කරණය

වාරි සෞභාග්‍යා වැඩසටහනට



කිත්සරදෙණිය වැව ප්‍රතිසංස්කරණය



පොතාන මහ වැව ප්‍රතිසංස්කරණය



මොරගොල්ල වැව ප්‍රතිසංස්කරණය



වැලිකුඹුර වැව ප්‍රතිසංස්කරණය



විජයබාහු කන්ද වැව ප්‍රතිසංස්කරණය

4.7 උපමාන පාදක ප්‍රදාන (අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කය

| අනු අංකය | වැඩසටහන /ව්‍යාපෘතිය | ප්‍රා,ලේ,කො, කොට්ඨාසය | වෙන්කළ මුදල(රු,මි,) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය | සටහන |
|---|---|---|---|---|---|---|
| 01 | හල්මිල්ලපිටිය ඇළ ප්‍රතිසංස්කරණය කිරීම | උකුවෙල | 2,000 | 1,722 | 100 | ඉදිකිරීම් අවසන් |
| 02 | දබගහමුල්ල ඇළ ප්‍රතිසංස්කරණය කිරීම | උකුවෙල | 0,500 | 0,500 | 100 | ඉදිකිරීම් අවසන් |
| | මුළු එකතුව | | 2,500 | 2,222 | | |

## සිවිල් ඉංජිනේරුමය උපදේශක සේවය ලබාදුන් ව්‍යාපෘති

මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර,හින්දු සංස්කෘතික, ද්‍රවිඩ අධ්‍යාපන සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ආයතනික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටත් අවශ්‍යතාවය මත මධ්‍යම පළාත් සභාවේ අනෙකුත් අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ආයතනික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටත්, මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අවසරය මත වාරි ඉදිකිරීම් හා සම්බන්ධ මධ්‍යම රජයේ දෙපාර්තමේන්තුවල ඉදිකිරීම් සඳහා අවශ්‍ය සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීමත් දෙපාර්තමේන්තු විසින් ඉටුකරනු ලැබේ.
එසේ ඉටුකරන ලද සිවිල් ඉංජිනේරු උපදේශන සේවා කටයුතු සහ එහි ප්‍රගතිය පිළිබඳ විස්තර වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

## වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන

සිවිල් ඉංජිනේරු උපදේශන සේවා කටයුතු යටතේ දිස්ත්‍රික්කයේ මිලියන 14,833 ක ව්‍යාපෘති 09 ක් සංවර්ධනය කිරීමට හැකිවී ඇත. එම විස්තර පහත දක්වා ඇත.

2021 වර්ෂයේ දිස්ත්‍රික්කයේ මිලියන 8,950 ක ව්‍යාපෘති 05 ක් නිමකර ඇත. මෙම ව්‍යාපෘති භෞතික ප්‍රගතිය 100 % ක් ලබා දී ඇත.

සිවිල් ඉංජිනේරු උපදේශන සේවා කටයුතු යටතේ දිස්ත්‍රික්කයේ මිලියන 15,684 ක ව්‍යාපෘති 12 ක් සංවර්ධනය කිරීමට හැකිවී ඇත. එම විස්තර පහත දක්වා ඇත.

| අංකය | දිස්ත්‍රික්කය | ඇස්තමේන්තු මුදල රු. මිලියන | 2021 වසරට නිර්දේශ කළ බිල්පත්වල වටිනාකම රු, | 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | මහනුවර | 15,000 | 14,833 | 100 |
| 2 | මාතලේ | 9,000 | 8,950 | 100 |
| 3 | නුවරඑළිය | 16,000 | 15,684 | 100 |
| | එකතුව | 40 | 39.467 | 100 |

## කෘෂි මාර්ග සංවර්ධන වැඩසටහන

මධ්‍යම පළාත් කෘෂිකර්ම,අමාත්‍යාංශයේ යටතේ කෘෂි මාර්ග සංවර්ධනය සඳහා සිවිල් ඉංජිනේරුමය උපදේශන සේවා මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටුකර ඇත.ඒ යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ රු.මිලියන 2,989 ක වියදමින් කෘෂි මාර්ග 03 ක් මාතලේ දිස්ත්‍රික්කයේ රු.මිලියන 4,479ක් යොදවා කෘෂි මාර්ග 04 ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ රු.මිලියන 1,952 ක් යොදවා කෘෂි මාර්ග 02 ක් නිමකරන ලදී.

## ගොඩනැගිලි නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම

මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ව්‍යාපෘති 4 ක් කෘෂිකර්ම දෙපාර්මේන්තුව ව්‍යාපෘති 29 ක් යටිනුවර ප්‍රාදේශීය සභාවේ එක් ව්‍යාපෘතියක් සඳයා ඉංජිනේරුමය උපදේශන සේවා යටතේ උපදේශන සේවාව ලබා දී ඇත.



මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ආපන ශාලාව ඉදිකිරීම



යටිනුවර ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම

## 4.7 ධාරිතා සංවර්ධනය

මේ යටතේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කරවීමේ අරමුණින් ඔවුන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම සිදුකරන ලදි. මෙම පුහුණු වැඩසටහන් අභ්‍යන්තරව හා ප්‍රධාන ලේකම් කාර්යාලයේ කළමනාකරණ සේවා පුහුණු ඒකකය මගින් සංවිධානය කරන ලද අතර පුහුණු වැඩසටහන් 17 ක් සඳහා නිලධාරීන් 35 ක් සහභාගි විය.මේ යටතේ නිලධාරීන් හා සේවකයන් යොමු කරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

**2021 වර්ෂයේ පුහුණු වැඩසටහන්**

| අනු අංකය | වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වැඩ අධ්‍යයන ශිල්පක්‍රම | 02 |
| 02 | විශ්‍රාම පූර්ව වැඩසටහන | 02 |
| 03 | කාර්යාල ක්‍රම හා කාර්යාළ කළමණාකරණය | 02 |
| 04 | රජයේ ගිණුම් ක්‍රම හා භාවිතය | 02 |
| 05 | නිවාඩු විෂයභාරනිළධාරීන්ගේ කාර්යභාරය | 01 |
| 07 | ග්‍රාමීය මට්ටමේ ප්‍රජාජල යෝජනා ක්‍රම සැළසුම් කිරීම සඳහා කාර්මික නිළධාරීන් පුහුණු කිරීම | 05 |
| 08 | Technical guideline for village tank desilting | 01 |
| 09 | පළාතේ සංවර්ධන සන්නිවේදන කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා පුහුණුව | 01 |
| 10 | G.P. මාර්ගත පුහුණු වැඩසටහන | 02 |
| 11 | දුරකථන ආචාර විධි හා යහපත් මහජන සම්බන්ධතා පුහුණුව | 01 |
| 12 | ස්ස්ථාවර වත්කම් කළමණාකරණය | 02 |
| 13 | භාණ්ඩ සමීක්ෂනය හා ,බඩාකරණය | 03 |
| 14 | විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම | 03 |
| 15 | විශ්‍රාම වැටුප් සකස්කිරීම | 03 |
| 16 | පුද්ගලික ලිපිගොනු නඩත්තුව | 03 |
| 17 | වැටුප් පරිවර්තන සකස් කිරීම | 02 |
| | **සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව** | **35** |

## 4.8 විගණන විමසුම්

### ලැබී ඇති විගණන විමසුම්

| අනු අංකය | ආයතනය | ලැබී ඇති විගණන විමසුම් සංඛ්‍යාව | පිළිතුරු යවා ඇති විගණන විමසුම් |
|---|---|---|---|
| 1 | රජයේ විගණන විමසුම් | 06 | 06 |
| 2 | පළාත් සභා විගණන විමසුම් | 00 | 00 |
| 3 | කෘෂිකර්ම අමාත්‍යාංශ විගණන විමසුම් | 05 | 05 |
| 3 | අභ්‍යන්තර විගණන | විගණන වාර්තා සංඛ්‍යාව 01 කි. අදාල අඩුපාඩු නිවැරදි කිරීම් සිදු කර ඇත. | |

2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

# මධ්‍යම පළාත් මිරිදිය ධීවර අංශය



**දැක්ම**

මධ්‍යම පළාතේ ජලාශ හා ජලජීවී සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතයට ගෙන මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ ජනතාවගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම

**මෙහෙවර**

මධ්‍යම පළාතේ මිරිදිය ධීවර සම්පත් ප්‍රශස්ත ලෙස කලමනාකරණය කරමින් ප්‍රෝටීන බහුල ආහාරයක් පළාතේ ජනතාවට ලබාගැනීමේ හැකියාව පහසු කරවීම සඳහා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම, සංවිධානගත කිරීම හා පහසුකම් සැලසීම මඟින් ආර්ථික ක්‍රියාවලියට ධීවර ප්‍රජාව සක්‍රීයව දායක කර ගැනීම සඳහා මෙහෙයවීම.

**5.1 අංශයේ අරමුණු හා කාර්යයන්**

- වැඩි දියුණු කළ මත්ස්‍ය සම්පත තුළින් මහජනතාවගේ පෝෂණ තත්වය සහ ආහාර සුරැකුම නංවාලීම
- ධීවර කර්මාන්තයේ සහ ඒ ආශ්‍රිත අනෙකුත් කර්මාන්තවල රැකියා උත්පාදන අවස්ථා වැඩිකිරීම
- ධීවර ප්‍රජාවගේ සමාජ, ආර්ථික තත්වයන් නගා සිටුවීම
- විසිතුරු මත්ස්‍ය සහ ඉස්සන් වගා ප්‍රවර්ධනය තුළින් ආදායම් උත්පාදනය හා ජනතාවගේ ආර්ථික තත්වය ඉහළ නැංවීම තුළින් ජීවන තත්වය උසස් කිරීම
- ධීවර ජනතාව වෙත අමතර ආදායම් උත්පාදන ක්‍රම සැකසීම තුළින් සම්ප්‍රදායික ජීවන වෘත්තියෙන් බැහැර වී අමතර රැකියා අවස්ථා කෙරේ නැඹුරු වීම.

## 5.2 හැඳින්වීම

ධීවර නිෂ්පාදනය ඉහල නැංවීම මඟින් රටෙහි ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණ තත්වය ඉහළ නැංවීම හා පසු අස්වනු නාස්තිය අවම කිරීම තුළින් ගුණාත්මක හා සෞඛ්‍යාරක්ෂිත බව පිළිගත් සම්මතයන් දක්වා ඉහල නැංවීමේ අරමුණින් සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තිය මගින් ප්‍රකාශිත ජාතික ධීවර ප්‍රතිපත්තිය මත කටයුතු කරමින් මධ්‍යම පළාතේ මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ලබාදෙන දායකත්වය වැඩිකිරීම සඳහා පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ ජලාශ ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය හා මිරිදිය ඉස්සන් ගහණය වර්ධනය කිරීමේ වැඩසටහන 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කෙරිණි. විශේෂයෙන් මේ තුළින්,

- සම්පත් ප්‍රශස්ත ලෙස කළමණාකරණය කරමින් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම
- පළාතේ කුඩා,මධ්‍යම හා විශාල පරිමාණ ජලාශවල මිරිදිය මත්ස්‍ය වගාව හා මිරිදිය ඉස්සන් වගාව ප්‍රවර්ධනය කිරීම.
- පළාත තුළ සත්ව ප්‍රෝටීන බහුල කිරීම තුළින් ජනතාවගේ ප්‍රෝටීන මන්ද පෝෂණය අවම කිරීම.
